**ජාතික ඉතිරිකිරීමේ බැංකුව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ("බැංකුව") සහ බැංකුවේ හා එහි පරිපාලිතයේ සමාගම්වල("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1)උපවගන්තිය ප්‍රකාරව, බැංකුවේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,බැංකුව සහ සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව සහ සමූහය කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව බැංකුව සහ සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලියට ස්වයංක්‍රීය නොවන ලෙස මැදිහත් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳ ඉහළ අවදානමක් නිරීක්ෂණය විය. ප්‍රධාන ශේෂ පිරික්සුම් දෙකක් ශාඛා සඳහා සහ ප්‍රධාන කාර්යාලය සඳහා වෙන වෙනම සකස් කරයි. සියලුම ශාඛාවල ශේෂ පිරික්සුම් CBOS (Central Back Office System )පද්ධතියෙන් සාරාංශ කර එය MS Excel පැතුරුම් පත් ආකෘතියට පරිවර්තනය කරමින් ශාඛා සඳහා තනි ශේෂ පිරික්සුම් නිර්මාණය කරයි. ප්‍රධාන කාර්යාල අංශවල ශේෂ පිරික්සුම් වෙන වෙනම ගෙන ප්‍රධාන කාර්යාලය සඳහා තනි ශේෂ පිරික්සුමකට ඒකාබද්ධ කෙරේ. අවසාන වශයෙන්, ශේෂ පිරික්සුම් දෙකම භාවිතා කරමින්, මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. මෙය දත්ත නැතිවීමට හෝ හානිවීමට හේතු විය හැක. එබැවින්, දත්ත නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස් කිරීමට පූර්ණ ස්වයංක්‍රීය පද්ධති විසඳුමක අවශ්‍යතාවය බැංකුව විසින් ඇගයීමට ලක් කළ යුතුය. | බැංකුව විසින් දැනටමත් ඉහත සාකච්ඡා කල සීමාවන් හරවා ගැනීමට හර බැංකු පද්ධති විසඳුමක්, ක්‍රියාත්මක කර ඇත. ප්‍රකාශිත ආකෘතියේ මූල්‍ය ප්‍රකාශය ජනනය කරනු ලබන වෙන් වූ ව්‍යාපාර පොදු ලෙජරයක් ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි ස්වයංක්‍රීය නොවන ලෙස සිදු කරනු ලබන මැදිහත් වීම අවම කලයුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට අන්තර් ශාඛා ශේෂය රු.මිලියන 269.328 ක් වූ අතර ඉකුත් වසරේ අනුරූප ශේෂය රු.මිලියන 103.260 ක් විය. ශාඛා ලෙජර සහ ප්‍රධාන කාර්යාල ලෙජර ගිණුම් කිහිපයක් එකතු කිරීමෙන් මෙම ශේෂය ලබාගෙන ඇත. මෙම ශේෂවලින් සමහර ශේෂයන් වසර කිහිපයකට පෙර සිට නොවෙනස්ව පවතී. | අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා පහත ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ.<br>ස්වයංක්‍රීය නොවන ලෙස පිළියෙල කල ප්‍රධාන කාර්යාල ගිණුම<br>නිරවුල් කිරීම සඳහා ශේෂයන් නියාමනය කිරීමට ශාඛා මගින් මාසිකව සැසඳීමේ ප්‍රකාශන සකස් කරමින් පවතී.<br>ස්වයංක්‍රීය ප්‍රධාන කාර්යාලය ගිණුම් | අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කළ යුතුය. |

කෙසේ වෙතත්, මෙම අන්තර් ශාඛා ගිණුම් ශේෂයන් සැසඳීම සඳහා බැංකුව විසින් කිසිදු ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ වෙනුවට සම්පූර්ණ ශේෂය රු.මිලියන 269.328 සඳහා සම්පූර්ණ වෙන් කිරීමක් කර තිබුණි.

අන්තර් ශාඛා ශේෂයන් සංසන්දනය කිරීම මාසිකව සකස් කරනු ලබන අතර පියවීම් ගිණුම් ඇතුළු නිරවුල් කිරීම සඳහා ශේෂයන් නියාමනය කිරීම සඳහා නිතිපතා රැස්වීම් පවත්වනු ලැබේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 47 වන වගන්තිය | බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට හිමිකම් නොපෑ තැන්පතු සංචිත ගිණුම හරහා කරන ලද ගෙවීම් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කළ යුතුය. කෙසේ වෙතත්, 2023 අවසානය දක්වා ගනුදෙනුකරුවන්ට ගෙවන ලද ඇති රු. මිලියන 834 විගණන දිනය වන 2024 මැයි 31වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | කාර්තුමය ඉල්ලීම් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇත. දැනට ඇති ශේෂයෙන් රු.මිලියන 750 ක් 2024 ජූලි මාසයේ බැංකුවට ලැබුණි. | ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල විය යුතුය. |
| (ආ) | 2007 අංක 12 දරන බැංකු පනතේ විධාන අනුව අනුකූලතා අවශ්‍යතා | | | |
| | (i)වගන්ති අංක 3 (2) (iv) | අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් යන දෙකෙන් වැඩි සංඛ්‍යාව සිටිය යුතු වුවත්, 2023 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පමණක් පත් කර ඇති අතර අනෙකුත් අධ්‍යක්ෂවරුන් පස්දෙනාම ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නම් කරඇත. | මෙම අවශ්‍යතාවය 2023.01.31, 2023.04.12,2023.07.21 සහ 2023.11.07 දිනැති අපගේ ලිපි මගින් පත් කිරීම් බලධාරියා වෙත දන්වා ඇත. ඒ අනුව ඉහත අවශ්‍යතාවය 2024.02.21 දින සම්පූර්ණ කරන ලදි. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අදාළ වගන්තිවලට බැංකුව අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii)වගන්ති අංක 3.2 (i) සහ 3. 2 (ix) | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) (ඒ) වගන්තියට අනුව, අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාස හතරක කාලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉහත සඳහන් කළ මාස හතරක කාලය තුළ බැංකුවේ සියලුම කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය නොමැතිව සිදු කර ඇති අතර නව පත්වීම් 2023 මැයි මාසයේදී සිදු විය.<br>2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ අධ්‍යක්ෂවරුන්ගේ අවම අවශ්‍යතා සපුරාලීමට බැංකුවට නොහැකි වූ අතර එබැවින් ආයතනික යහපාලන නියෝගයේ 3.2 (i) වගන්තියට අනුකූල නොවීම නිරීක්ෂණය විය. | මෙම අවශ්‍යතාවය 2023.01.31, 2023.04.12, 2023.07.21 සහ 2023.11.07 දිනැති අපගේ ලිපි මගින් පත් කිරීම් බලධාරියා වෙත දන්වා ඇත. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේඅදාළ වගන්තිවලටබැංකුව අනුකූල විය යුතුය. |
| (iii)වගන්ති අංක 3 (6) (ii) (ඒ) | විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු විය යුතු වුවද, බැංකුවේ පරිපාලිත ආයතනයක සභාපතිවරයෙකු විගණන කමිටුවේ සභාපති ධූරය දැරීම හේතුවෙන් බැංකුවේ විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු නොවීය. | 2024 පෙබරවාරි දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සාමාජිකයින් හතරකින් පමණක් සමන්විත විය. එම හතර දෙනා අතරින් එකම වරලත් ගණකාධිකාරවරයා වන ඔහුව 2023.05.23 අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ සභාපති වරයා ලෙස පත් කරන ලදි. අධ්‍යක්ෂක මණ්ඩලය පත් කරන තුරු අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු සමග සියළුම අනෙකුත් කමිටු සහ පරිපාලිත දෙක සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය කළමනාකරණ කරන ලදි. මේ අතර තුර කාලයේදි දුෂ්‍යන්ත බස්නායක මහතා | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අදාළ වගන්තියට බැංකුව අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පරිපාලිත සමාගමක සභාපතිවරයා ලෙස මුදල් අමාත්‍යංශය විසින් 2023.06.15 දින පත් කරන ලද අතර ඒ සඳහා අදාල යෝග්‍යතාවය සහ හිමිකම් අනුමැතිය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලැබුණි. එම පුද්ගලයා ම විගණන කමිටු මණ්ඩල සභාපතිවරයා ලෙස තබා ගැනීම හැර වෙනත් විකල්පයක් මණ්ඩලයට තිබුණේ නැත. අපි මේ තත්ත්වය මහ බැංකුවට දැනුම් දුන්නා. කෙසේ වෙතත්, 2024.02.21 දින වරලත් ගණකාධිකාරීවරයෙකු වන අශේන් ජයසේකර මහතා පත්කිරීමෙන් පසු එම අවශ්‍යතාවය වහාම විසඳා ඇත. | |
| | (iv) වගන්ති අංක(3)(6)(iv)(එෆ්) | නාමයෝජනා කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතීත්වය දරනු ලැබිය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් සමන්විත වීම වඩාත් සුදුසු වුවද, නාම යෝජනා කමිටුවේ බහුතරය ස්වාධීන නොවන අධ්‍යක්ෂක වරුන්ගෙන් සමන්විත බව නිරික්ෂණය විය. | අධ්‍යක්ෂකවරුන් පස්දෙනා අතරින් වර්තමානයේ ස්වාධීන අධ්‍යක්ෂකවරුන් තුන්දෙනෙක් පමණක් සිටී. අධ්‍යක්ෂ මණ්ඩල කමිටු නැවත පිහිටු විමට අධ්‍යක්ෂක මණ්ඩල ඉතිරි සාමාජිකයින් දෙදෙනා පත් කිරිම සඳහා බැංකුව බලාපොරොත්තුවෙන් සිටී. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අදාළ වගන්තියට බැංකුව අනුකූල විය යුතුය. |
| (ඇ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සාමූහික ගිවිසුමෙහි ඇතුලත් ප්‍රතිපාදන පරිදි උපයන විට ගෙවන බද්ද හෝ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද බැංකුව විසින් අදාළ සේවකයාගේ වැටුපෙන් අඩු කිරීම වෙනුවට තම අරමුදල්වලින් 2023 ජනවාරි තෙක් ගෙවා තිබුණි. පසුගිය වසර හතක ගෙවීම් විස්තර පහත පරිදි වේ. | බැංකු සේවකයන්ගේ වේතන සාමූහික ගිවිසුම අනුව තීරණය කෙරේ. ඒ අනුව තක්සේරු වර්ෂය සඳහා උපයන විට ගෙවීම් බදු බැංකුව විසින් තම අරමුදල් වලින් ගෙවන ලදි. කෙසේ වෙතත් 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උපයන විට ගෙවීමේ බදු | බැංකුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) දෙන ලද චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | තක්සේරු වර්ෂය - මුදල රු.මිලියන<br>2016/2017 - 155.15<br>2017/2018 - 157.11<br>2018/2019 - 125.75<br>2019/2020 - 146.8<br>2020/2021 - 11.8<br>2021/2022 - 30.44<br>2022/2023 (2023 ජනවාරි 01 දක්වා) - 42.99 | මුදල්, ආර්ථික ස්ථායිතාවය හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශය මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 1/2023 අනුව සේවකයන් විසින් ගෙවන ලදී. | |
| (ඇ) | 2013 අගෝස්තු 23 අංක 1824/23 දරණ අතුරු සම්මත ගැසට් නිවේදනය | බෝග රක්ෂණ ලෙස 2023 බදු පසු ලාභයෙන් සියයට 1 ක ප්‍රතිශතයක් අය කර නොතිබුණි. | 2023 වර්ෂයේ බදු පසු අලාභයක් පැවති නිසා බැංකුව බෝග රක්ෂණය වෙනුවෙන් වෙන් කිරීමක් සිදු කොට නැත. | බැංකුව බෝග රක්ෂණ බදු ලෙස බදු පසු ලාභයෙන් සියයට 1 වෙන් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 7,216 ක් ලාභයක් වූ අතර ඊට අනුරූප පෙර වර්ෂයේ ලාභය රු. මිලියන 2,530 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 4,686 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රු. මිලියන 4,909 ක අදායම් බදු වියදම පහළ යාම හේතු වී තිබුණි.

2023 වර්ෂය තුළදී, ණය සහ අත්තිකාරම්, ණය සහ අනෙකුත් උපකරණ සහ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොලීවලින් ලද පොලී වැඩිවීම හේතුවෙන් බැංකුවේ මුළු පොලී ආදායම රු. මිලියන 54,027 කින් හෙවත් සියයට 31 කින් ඉහළ ගොස් තිබුණි. තැන්පත්කරුවන් සඳහා ගෙවන ලද පොලී වැඩිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා මුළු පොලී වියදම් රු. මිලියන 56,925 කින් හෙවත් සියයට 41 කින් ඉහළ ගොස් තිබුණි.

2022 වර්ෂය සඳහා බැංකුවේ මුළු පොලී ආදායමට ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ පොලි අනුපාත, ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමයේ හිඟ පොලි සහනාධාර ලැබිය යුතු ශේෂය මත භාණ්ඩාගාරයේ ලැබිය යුතු පොලී ආදායම ලෙස හඳුනාගත් රු. මිලියන 6,764 ක පොලී මුදලක් ඇතුලත් වේ. 2022 දෙසැම්බර් මස 19 වන දින කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2023 ජනවාරි 13 වන දින භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලබාදී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| විස්තර | විචල්‍ය මුදල වැඩි වීම/(අඩු වීම) (රු .000) | විචලනය % | විචලනයට හේතුව |
|---|---|---|---|
| ශුද්ධ පොලී ආදායම | (2,897,733) | (9) | ප්‍රධාන වශයෙන් තැන්පතු සඳහා පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් පෙර වසර හා සසඳන විට පොළී වියදම 41% කින් ඉහළ ගොස් ඇති අතර එය පොළී ආදායමෙන් සීයයට 31 ක වැඩි විමට වඩා වැඩිය. |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | (663,842) | (34) | ණය සහ කාඩ්පත් ආශ්‍රිත සේවාවන්ගෙන් ජනනය වන ගාස්තු සහ කොමිස් ආදායම අඩු වීම. |
| ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම | (157,384) | (38) | විදේශ විනිමය ලාභයෙන් නැවත තක්සේරුව රු.මිලියන 107.62 කින් සහ ලාභාංශ ආදායම රු. මිලියන 71.54 කින් අඩු වීම හේතු විය. |
| හානිකරණ ගාස්තු | (603,370) | (12) | ප්‍රධන වශයෙන් ණය සහ අත්තිකාරම් අඩු වීම හේතුවෙන් ණය සහ අත්තිකාරම් සඳහා වන හානිකරණ ප්‍රතිපාදනය සියයට 2 කින් හෙවත් රු.මිලියන 108 කින් අඩු වී ඇත. |
| මුළු වියදම් | 52,847,157 | 31 | හානිකරණ ගාස්තු, මුල්‍ය සේවා මත එකතු කල අගය මත බද්ධ සහ අදායම් බදු වියදම් පිළිවෙලින් රු මිලියන 603.37, රු මිලියන 2,043 සහ රු.මිලියන 4,909 කින් අඩු වී ඇත. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| විස්තර | ආංශික අනුපාතය * | බැංකුව | |
|---|---|---|---|
| **ලාභදායිතා අනුපාතය** | | **2023** | **2022** |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) (%) | 10.6 | 9.36 | 3.40 |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) (%) | 1.5 | 0.26 | 0.28 |
| පොලී ආන්තිකය | 3.6 | 1.79 | 2.03 |
| **වත්කම් ගුණාත්මක අනුපාතය** | | | |
| මුළු ණය සහ අත්තිකාරම් වලට ස්ථර 3 ණය අනුපාතය (ශුද්ධ හානිකරණය) | 10.7 | 4.59 | 2.82 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR)** | | | |
| CAR -ස්ථර I අනුපාතය (අවමය 8% කි) | 13.8 | 16.91 | 15.78 |
| මුළු CAR අනුපාතය (අවමය 12.5% කි) | 16.9 | 19.26 | 18 |

| | | | |
|---|---|---|---|
| **ද්‍රවශීලතා වත්කම් අනුපාතය** | 44.9 | 54.99 | 40.62 |

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලින් ආංශික අනුපාත උපුටා ගෙන ඇත.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී බැංකුවේ ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) අනුපාතය සහ වත්කම් මත ප්‍රතිලාභ (ROE) අනුපාතය පිළිවෙලින් සියයට 5.96 කින් සහ සියයට 0.02 කින් අඩු වී තිබුණි.

(ii) පසුගිය වර්ෂය හා සසඳන විට ද්‍රවශීලතා වත්කම් අනුපාතය සියයට 14.37 කින් වැඩි වී තිබුණු අතර එය කර්මාන්තයේ සාමාන්‍ය වූ සියයට 44.99 ට වඩා වැඩි ය.

(iii) බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 2023 දෙසැම්බර් 31 වන දිනට සියයට 1.26 කින් වැඩි වී තිබුණු අතර එය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 12.5 ට වඩා වැඩි ය.

(iv) 2023 වසරේ බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 0.24 කින් අඩු වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ පොලී ආන්තිකය කර්මාන්තයේ පොලී ආන්තිකය වන සියයට 3.6 ට වඩා සැලකිය යුතු ලෙස අඩු ය. අඩු පොලී ආන්තිකය සඳහා හේතු වන්නේ වෙළඳපොල පොලී අනුපාත වැඩි වීම නිසා පොලී වියදම් ඉහල යාම හා ස්ථාවර අනුපාතයකට ලබා දී ඇති ණය හා අත්තිකාරම් ආපසු ගෙවීමට සහ දිගුකාලීනව භාණ්ඩාගාරයේ කරන ලද ආයෝජන නැවත ගෙවීමට බැංකුවට නොහැකිවීම සහ සිදුකරනු ලබන බැඳුම්කර ආයෝජනවල පොලිය අඩු වීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 මැයි 31 දිනට වංචනික ක්‍රියාකාරකම් 95 කින් බැංකුවට සිදු වූ මුළු අලාභය රු.මිලියන 60.56 ක් වූ අතර එය 2024 මැයි 31 දිනට වංචනික ක්‍රියාකාරකම් 107 කින්<br>රු.මිලියන 81.72 දක්වා වැඩි වී තිබුණි.<br>• රු.මිලියන 44.08 ක අලාභ සම්බන්ධ වංචනික ක්‍රියාකාරකම් වසර පහකට වඩා පැරණි ය.<br>• වංචනික සිද්ධීන් තිහකින්(30) බැංකුවට සිදු වූ රු.මිලියන 89.88 ක මුළු අලාභය කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කර තිබුණු අතර එම අලාභවල හිඟ ශේෂය රු. මිලියන 49.53 ක් හෙවත් 2024 මැයි 31දිනට මුළු අලාභය වූ රු. මිලියන 81.72න් සියයට 61 ක් විය.<br>• වංචනික සිද්ධීන් පනස් පහක් (55) ක් 2021 සිට 2024 දක්වා සිදුවී ඇති ස්වයංක්‍රිය ටෙලර් කාඩ්පත් ආශ්‍රිත වංචාවන් වේ. ඉන් රු. මිලියන 3.22ක වටිනාකමකින් යුත් වංචා 38ක්, තුන්වැනි පාර්ශවයක් විසින් ගෙවුම් | මෙම වාර්තාවේ අදහස් සඳහා ඇමුණුම් 01 යොමු කෙරේ. | වංචනික ක්‍රියාකාරකම් වළක්වා ගැනීමට සහ ඒවා අඛණ්ඩව අධීක්ෂණය කිරීමට බැංකුව විසින් ශාඛා මෙහෙයුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

යෙදුමක් හරහා හැක් කරන ලද කාඩ්පත් ආශ්‍රිත තොරතුරු භාවිතයෙන් මාර්ගගත ගණුදෙනු සිදු කිරීම මඟින් කර තිබුණි. විගණිත දිනය වූ 2024 මැයි 31 දින දක්වා හැක් කිරීම් ආශ්‍රිත වංචනික සිද්ධීන් 38 ක් සඳහා කිසිදු රක්ෂණ වන්දියක් ලැබී නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මේ වන විට වසර 07කට වැඩි කාලයක් ගත වී ඇතත්, 2016 අප්‍රේල් මාසයේ සිට එ.ජ.ඩො 13,015,224 ක (සංශෝධිත - බදු රහිත) ඇස්තමේන්තුගත වියදමින් ආරම්භ කරන ලද හර බැංකුකරණ විසඳුම් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට බැංකුව අපොහොසත් වී තිබූ අතර එ.ජ.ඩො 5,998,971 ක් මේ දක්වා වියදම් කර තිබුණි. කර්මාන්තයේ අනෙකුත් බැංකු නිරන්තරයෙන් නවීන තාක්‍ෂණයන් වැලඳ ගැනීම මධ්‍යයේ මෙවැනි ඉහළ තාක්‍ෂණික යෙදුම් ක්‍රියාත්මක කිරීමට මෙතරම් දිගු කාලයක් ගත කිරීම අවසානයේ පද්ධතිය යල්පැනීමට හේතු විය හැක. | නව හර බැංකු විසඳුම 2024 සැප්තැම්බර් 18 වන දින ක්‍රියාත්මක කරන ලදී.<br>බැංකුව 2016 අප්‍රේල් මාසයේදී හර බැංකුකරණ විසඳුම ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ අතර ටෙමෙනොස්-AG /ටෙමෙනොස් මූලස්ථානය-SA වෙත ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2019 අප්‍රේල් මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇත.ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රධාන අදියර දෙකකින් සමන්විත විය. උදාහරණ ලෙස කැමැත්ත ප්‍රකාශකිරීම (EOI) සඳහා කැඳවීම සහ පූරව සුදුසුකම්ලත් ලංසුකරුවන් සඳහා යෝජනාවක් (RFP) නිකුත් කිරීම. ඒ අනුව, EOI සඳහා කැඳවීම සහ ලැබුණු යෝජනා ඇගයීම සහ ලංසුකරුවන් කෙටි ලැයිස්තු ගත කිරීම 2017 මාර්තු වන විට අවසන් කරන ලද අතර පූරව සුදුසුකම්ලත් ලංසුකරුවන්ට RFP නිකුත්කරන ලදී. කෙසේවෙතත් ප්‍රසම්පාදනයේ සංකීර්ණ ස්වභාවය හේතුවෙන් ක්ෂේත්‍ර අඩවි පිවිසීම ඇතුලත්ව කෙටි ලැයිස්තුගත ලංසුකරුවන් විසින් ඉදිරිපත්කරන ලද ලංසු ඇගයීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත විය.<br><br>හර බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය 2019 ඔක්තෝම්බර් මස සිට පමණක් ආරම්භ කරන ලද අතර ව්‍යාපාරික අවශ්‍යතා ඒකරාශී කිරීමේ | සාධාරණ කාලසීමාවක් තුළ භාණ්ඩාගාර කාර්යයන්, උකස් කාර්යයන් සහ තැපැල් බැංකුකරණ කටයුතු හර බැංකු පද්ධතියට ඒකාබද්ධ කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගැනීම අවශ්‍ය වේ. |

වැඩමුළු අවසන් කිරීමෙන් පසු කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුගේ උපදේශකයින් රට හැර ගිය අතර ප්‍රමාදයට ඍජුවම බලපාන ලද ජාත්‍යන්තර සංචරණ සීමාවන් හේතුවෙන් ඔවුනට 2021 සැප්තැම්බර් වන තෙක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට නොහැකි විය. තවද, බැංකුවේ අවශ්‍යතාවය අනුව ණය සම්භවය සහ වෙනත් මොඩියුල ඇතුලත් කිරීම සහ වෙනස් කිරීම හේතුවෙන් ශාඛා 5 සිට Bing Bang ප්‍රවේශය දක්වා rollout ප්‍රවේශය වෙනස් කිරීමට ප අමතර කාලය වෙන් කිරීමට සිදුවිය.

තවද, ආරක්ෂක හේතූන් මත වෙබ් අඩවියේ සේවය කරන උපදේශකයින් රටින් පිටව ගිය බැවින් 2022 අප්‍රේල් සිට අගෝස්තු දක්වා රට තුළ ඇති වූ නොසන්සුන්තා ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ප්‍රගතියට අහිතකර ලෙස බලපෑවේය.

කොවිඩ් - 19 වසංගතය සහ අනෙකුත් වෙනස්කම් හේතුවෙන් ව්‍යාපෘති කාලසීමාවන්ට ඇති බලපෑම අවම කිරීම සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

බැංකුව විසින් ව්‍යාපාර අවශ්‍යතා අවසන් කරන අවස්ථාවේදී, එනම් 2021 දී පවතින හර බැංකුකරණ විසඳුමේ නවතම අනුවාදය ක්‍රියාත්මක වීම නිසා නව කාර්යයන් හා හැකියාවන් බැංකුව සඳහා ලබාගත හැකිය.

(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරීත්වය විසින් අවදානම් කළමනාකරණ අංශය විසින් ලබා දී ඇති නිර්දේශ සහ අදහස් නොසලකා හැර ඇති අවස්ථා

මෙම ගැටලුව මීට පෙරද මතු වූ බව අපට නිරීක්ෂණය විය.කෙසේ වෙතත් අප විසින් නැවත අවධාරණය කරනු ලබන්නේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් අවදානම් අංශය ඉදිරිපත් කරන ලද අවදානම්

අවදානම ඉහළ ගනුදෙනුකරුවන්ට ණය අනුමත කිරීමට පෙර අවදානම් කළමනාකරණ අංශය

| | | | |
|---|---|---|---|
| | කිහිපයක් නිරීක්ෂණය විය. අවදානම් කළමනාකරණ අංශය විසින් සිය අවදානම් තක්සේරු වාර්තා මගින් සමහර ප්‍රධාන ණය සම්බන්ධ අවදානම් පැහැදිලිව හඳුනාගෙන ඇතත්, අවධාරණය කළ අවදානම් සැලකිල්ලට නොගෙන එවැනි ණය ලබා දීමට ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. එම ණයවලින් සමහරක් 2023 මැයි 31 දිනට අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි.ණය ගැණුම්කරුවන් සඳහා ලබා දී ඇති එවැනි ප්‍රධාන ණය දෙකක් , ආර් පී අයි නම් මාලදිවයින් සමාගමකට (2018 දී ලබාදුන් රු. මිලියන 1,806 ට සමාන ඒ.ජ.ඩො. මිලියන 9) සහ ටෙක්නෝ පාර්ක් ඩිවලප්මන්ට් පුද්ගලික සමාගමට (2021 දී ලබාදුන් රු. මිලියන 750) ලබා දී ඇත. 2024 මැයි 31 දිනට එම ණය දෙකේ මුළු හිඟ ශේෂයන් පිලිවෙලින් රු. මිලියන 3,979 ක් සහ රු. මිලියන 332 කි. | වාර්තා සලකා බලනු ලබන අතර, එය ඇගයීමට හා නිවැරදි ණය තීරණයක් ගැනීමට ඉතා වැදගත් වන බවයි. සියලුම ණය පත්‍රිකා විශේෂයෙන් විශාල වටිනාකම් සහ සියලුම ආයතනික පහසුකම් ගනුදෙනුකරුවන් පිළිඹිබුකරයි. ඔවුන්ගේ මතය ණය කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශය වෙත ඉදිරිපත්කරනු ලබයි. ණය කමිටු නිර්දේශය සහ අවදානම් වාර්තාව යන ද්විත්වයත් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවත් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ.<br><br>වාර්තාවේ සඳහන් ණය, එනම් ආර් පි අයි සහ ටෙක්නෝ පාර්ක් පිළිවෙලින් 2018 ජුනි 21 සහ 2021 නොවැම්බර් 30 දින ලබා දී ඇති අතර ඒවා පිලිවෙලින් 2021 සැප්තැම්බර් සහ 2022 නොවැම්බර් මාසවලදී අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇත. | විසින් ඉස්මතු කරන ලද අවදානම් සම්බන්ධ නිර්දේශ සහ අදහස් කෙරෙහි බැංකුව අවධානය යොමු කළ යුතුය. |
| (ii) | බැංකුවේ අවදානම් කළමනාකරණ අංශය විසින් 2018 වර්ෂයේ සිට තෝරාගත් අලාභ සිදුවීම් සඳහා මූල හේතු විශ්ලේෂණය (Root Cause analysis) සිදු කර ඇති අතර නැවත සිදුවීම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පාර්ශ්වයන්ගේ අවධානයට යොමු කර ඇත. කෙසේ වෙතත්, බැංකුවේ කාර්ය මණ්ඩලයේ එවැනිම වංචනික ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය විය. එබැවින්, අවදානම් කළමනාකරණ අංශය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශ්වයන්ගේ අවධානය යොමු වී නොමැති බව අනාවරණය විය. | බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් සමන්විත මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවේදී සෑම මසකම මූල හේතු විශ්ලේෂණය පිළිබඳ සාකච්ඡා කරයි. අවදානම් කළමනාකරණ අංශය විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සහ මීළඟ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රැස්වීමට වාර්තා කල යුතුය. මෙම ක්‍රියාවලිය පැහැදිලිවම පෙන්නුම් කරන්නේ අදාළ සියලු පාර්ශ්ව කෙරෙහි අවධානය යොමු කර ඇති බවයි. | අඛණ්ඩ වංචනික ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා, වාර්තා වූ සිද්ධීන් සම්බන්ධයෙන් බැංකුව දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) පෙර රැස්වීම්වලින් පැන නැගුණු නොවිසඳුණු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අවශ්‍ය වුවද, මෙහෙයුම් අවදානම් කමිටු රැස්වීම් වලදී පවරා ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කිරීමට යාන්ත්‍රණයක් නොතිබුණි. | පහත දක්වා ඇති පරිදි බැංකුවේ මෙහෙයුම් අලාභ අයකරගැනීමට හා වාර්තා කිරීමට යාන්ත්‍රණයක් පවතී.<br>• අභ්‍යන්තර විගණන අංශය හරහා මෙහෙයුම් අලාභ ස්වයංක්‍රිය නොවන ලෙස වාර්තා කිරීම සහ මෙහෙයුම් අලාභ සිදුවීම් දත්ත වාර්තා කිරීමේ පද්ධතිය මඟින් අදාළ ශාඛා කළමනාකරුවන් විසින් පරිපාලන අංශය වෙත වාර්තා කරනු ලබයි.<br>• පරිපාලන අංශය මඟින් රක්ෂණ සේවා සපයන්නන් වෙත විස්තර දැනුම් දීම.<br>• රක්ෂණ සේවා සපයන්නන් විසින් හිමිකම් දැනුම්දීම හිමිකම් අංක නිකුත්කිරීම මඟින් තහවුරු කරයි.<br>• විමර්ශන අවසන් කිරීමෙන් පසු විගණන වාර්තාව සමඟ හිමිකම් පෑමට අදාළ ලේඛන රක්ෂණ සේවා සපයන්නා වෙත යවනු ලැබේ. (වංචා සඳහා පමණි)<br>• අලාභ ගැලපුම්කරුවන් විසින් හිමිකම් (වංචා උකස් සහ වත්කම් හානි) තක්සේරු කිරීමෙන් පසු, හිමිකම් පෑමේ ලැබිය යුතු කොටස චෙක්පතක් සහ සේවා සපයන්නා වෙත භාරදිය යුතු ස්ථාවර වත්කම් හානිවල සුන්බුන් අයිතම මගින් පියවනු ලැබේ.<br>• හිමිකම් චෙක්පත විස්තර සමඟ මුල්‍ය අංශය වෙත ඉදිරිපත් කිරීම.<br>ආයතනික කළමනාකරණ කමිටුවට වාර්තා කිරීමටත් ඒවා විසඳන තෙක් නොවිසඳුණු කරුණු සහ යෝජනාවේ ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් යාන්ත්‍රණයක් හඳුන්වාදෙනු ලැබේ. | පවරන ලද ක්‍රියාවන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීමට බැංකුව විසින් යාන්ත්‍රණයක් හඳුන්වාදිය යුතුය. |
| (iv) බැංකුවේ ප්‍රධාන ක්‍රියාවලින්හි පාලන අඩුපාඩු හඳුනාගැනීම සඳහා අවදානම් හා පාලන තක්සේරු කිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහා (RCSA) පවත්වන ලද නමුත් ප්‍රසම්පාදනය, ගෙවීම් සහ ජාත්‍යන්තර බැංකුකරණ කටයුතු | අවදානම් කළමනාකරණ අංශය, අවදානම් හා පාලන තක්සේරුකිරීම් සඳහා තීරණාත්මක ක්ෂේත්‍රවලට ප්‍රමුඛත්වය දී ඇත. භාණ්ඩාගාර පසු කාර්යාල මෙහෙයුම් සහ ජාත්‍යන්තර බැංකුකරණ කටයුතු ආවරණය ඉතිරි ජාත්‍යන්තර බැංකුකරණ කටයුතු | වැදගත් බැංකු ක්‍රියාවලින් සඳහා අවදානම් සහ පාලන තක්සේරු කිරීම් කල යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා අවදානම් හා පාලන තක්සේරු කිරීම් මෙහෙයුම් සිදුකර නොතිබුණි. | කාර්යයන් ප්‍රසම්පාදනය සහ ගෙවීම් සඳහා වර්ෂය තුලදී මෙහෙයවයි. | |
| (v) අවදානම් කළමනාකරණ අංශයේ ප්‍රධානියා ආයතනික කළමනාකරණ තනතුරක් නොවන අතර එය බැංකුව තුළ ඇති අවදානම් කළමනාකරණ කාර්යයේ ස්වාධීනත්වයට බලපා ඇති බව නිරීක්ෂණය විය. | මෙය නැවත නැවතත් සැලකිලිමත් වන කරුණක් බව අපට වැටහේ. කෙසේ වෙතත්, කරුණාකර පහත සඳහන් දේ පිලිබඳ අවධානය යොමු කරන්න.<br>2019 බැංකු පනතේ නිර්ණය 01 හි 2.1 (xix) වගන්තියට අනුව, ආයතනික ව්‍යුහයේ ප්‍රධාන විධායක නිලධාරී මට්ටමට පහළින් ආසන්න ස්ථර දෙකක සිටින නිලධාරීන්, එනම් සහකාර සාමාන්‍යාධිකාරි මට්ටමේ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන් / ප්‍රධාන කලමනාකර නිලධාරීන් (KMPs ) ලෙස තීරණය වේ. ඒ අනුව, අවදානම් කළමනාකරණ අංශයේ ප්‍රධානියා සහකාර සාමාන්‍යාධිකාරි (AGM) ශ්‍රේණියේ බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (BIRMC) සෘජුවම වාර්තා කරයි.<br><br>එබැවින් අවදානම් කළමනාකරණ අංශයේ ප්‍රධානියා බැංකුවේ ස්වාධීන ප්‍රධාන කළමනාකාර තනතුරක් දරයි.<br><br>මෙම කරුණ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මණ්ඩලයේ (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා කර ඇත. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වන්නේ, සහකාර සාමාන්‍යාධිකාරි මට්ටමේ සිටින බැංකුවේ ප්‍රධාන අවධානම් නිලධාරිගේ (CRO) වත්මන් සංවිධාන ව්‍යුහය අවශ්‍ය වුවහොත් අනාගතයේදී වැඩිදියුණු කළ හැකි බවයි.<br>තවද, දැනට බැංකුවේ කළමනාකරණ ව්‍යුහය ආයතනික කළමනාකරණය සහ විධායක කළමනාකරණය යන ප්‍රධාන ස්ථර දෙකකින් සමන්විත වේ. ආයතනික කළමනාකරණයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් | අවදානම් කළමනාකරණ අංශය එහි ක්‍රියාකාරකම්වල ඵලදායි සහ ස්වාධීන ක්‍රියාකාරිත්වය සඳහා ආයතනික කළමනාකාරීත්වයේ පුද්ගලයකු විසින් මෙහෙයවීම සුදුසු වේ. |

| | | | |
|---|---|---|---|
| | | (DGM) ඇතුළත් වන අතර විධායක කළමනාකරණයට සහකාර සාමාන්‍යාධිකාරීවරුන් (AGM) ඇතුළත් වේ.<br>ආයතනික කළමනාකරණ කාණ්ඩයට , සහකාර සාමාන්‍යාධිකාරීවරුන් (AGMs) ඇතුළත් කිරීමට යෝජනා කරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අපි යෝජනා කරමු. | |
| (ඇ) | 1973 සිට 1996 දක්වා කාලය තුළ අනුරාධපුර, ඇල්පිටිය, ගල්නෑව, කතරගම, කිරිදිවැල, මොණරාගල, රත්නපුර සහ කැකිරාව යන ප්‍රදේශවල පිහිටි ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා බැංකුව රු. මිලියන 83.6ක් වැය කර තිබුණද, එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලැබී තිබුණේ නැත. 2023 වසර අවසානය වනවිටත් එම ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි. | අනුරාධපුර: නීති අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 2024.09.12 දින අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ අදාළ ලිපි ලේඛන එකතු කර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කටයුතු තවමත් සිදුවෙමින් පවතී.<br><br>ඇල්පිටිය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබාගෙන ඇත. ලේඛනය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සකස් කරමින් පවතී.<br><br>ගල්නෑව: බැංකුව මහවැලි අධිකාරියෙන් බදු ගිවිසුම ඉල්ලා ඇත.<br><br>කතරගම සංචාරක බංගලාව: සම්පූර්ණ කරන ලද බදු ගිවිසුම ලැබිණි.<br><br>කැකිරාව: බැංකු කළමනාකාරිත්වය බදු ගිවිසුම අත්සන් කර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට යවා ඇත. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ගිවිසුම අපේක්ෂාවෙන් සිටිමු.<br><br>කිරිදිවැල: ජනාධිපති ලේකම් කාර්යාලයේ කල්බදු ගිවිසුම සකස් වෙමින් පවතී.<br><br>මොණරාගල: බැංකුව බදු ගිවිසුම අත්සන් කර ඉඩම් කොමසාරිස් ජනරාල් | සාධාරණ කාලයක් තුළ ඉහත ඉඩම් සඳහා බැංකුව විසින් බදු අයිතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ගිවිසුම අපේක්ෂාවෙන් සිටිමු.<br><br>රත්නපුර: බැංකුව බදු ගිවිසුම අත්සන් කිරීමට නියමිතව ඇත. | |
| (ඇ) | ප්‍රාදේශීය කළමණාකරුවන්ගෙන් ලද තහවුරු කිරීම්වලට අනුව, 2024 අප්‍රේල් 30 වන දිනට රු.මිලියන 262.295, ක් වූ ප්‍රදානය කරන ලද ණය මුදල්වලට අදාළ ණය ලිපිගොනු 330 ක් අස්ථානගත වී තිබුණි. අස්ථානගත වූ ණය ලිපිගොනු අතර පුද්ගලික ණය ලිපිගොනු 95 ක්, නිවාස ණය ලිපිගොනු 229 ක්, නීති ලිපිගොනු 4 ක් සහ ස්ථාවර තැන්පතු මත ණය ලබා දී ඇති ණය ලිපිගොනු 2 ක් ඇතුළත් වුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (i) මෙම අස්ථානගත වූ ණය ලිපිගොනු 330 න් සියයට 29 ක් හෙවත් ණය ලිපිගොනු 96 ක් අක්‍රීය ණය ගණයට අයත් වුණි.. ඒවා අතරින් ලිපිගොනු 43 ක් නිවාස ණයවලට, ලිපිගොනු 81 ක් පුද්ගලික ණයවලට අදාළ ඒවා වුණි. 2024 අප්‍රේල් 30 දිනට එම අක්‍රීය ණයවල මුළු හිඟ මුදල රු.මිලියන 39.699 ක් වූ අතර එය ප්‍රධානය කර ඇති මුළු වටිනාකමින් සියයට 68 ක් විය. | අවධානයට පැණනැගුනු පරිදි,ස්වාභාවික විපත්,වංචනික ක්‍රියාකාරකම්, මෙහෙයුම් ගැටළු යනාදිය හේතුවෙන් නිවාස ණය ලිපිගොනු සහ පුද්ගලික ණය ලිපිගොනු විනාශ වී හෝ අස්ථානගත වී ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව මෙම කාණ්ඩය පදනම් කරගෙන අයකිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.පරිගණක පද්ධතියේ ඇති තොරතුරු භාවිතා කරමින් බැංකුව සිය අයකිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කරයි. | සෑම ශාඛාවකම ලිපිගොනු කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| | (ii) අස්ථානගත වූ ණය ලිපිගොනු 330 න්, රු. මිලියන1.434 ක මුළු හිඟ ශේෂයක් සහිත ණය ලිපිගොනු හතරක් නීතිමය ක්‍රියාමාර්ග යටතේ පැවතුණි. මෙම ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන් බැංකුවට ණය ගැණුම්කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීම සහ ණය ආපසු අයකර ගැනීමෙන් පසු ගනුදෙනුකරුවන්ගේ ඔප්පු මුදා හැරීමට නොහැකි වේ. මෙමගින් දිගුකාලීනව බැංකුවේ යහපත් ප්‍රතිරූපය හානිකරණය විය හැකිය. | මෙම ණය සඳහා ණය ඉල්ලුම් පත්‍රයේ විස්තර, ලබාදීමේ තොරතුරු සහ ආපසු ගෙවීමේ වාර්තා පරිගණක පද්ධතියේ ඇත. ඒවා අවශ්‍ය නම් ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට පදනම සපයමින් ණය ගැණුම්කරුවන්ගේ හිඟ වගකීම් ඔප්පු කිරීමට ප්‍රමාණවත් වේ. තවද පරිගණක පද්ධතිය මගින් ණය ලබා දීම, පසුගිය ආපසු ගෙවීම් සහ අනාගත ආපසු ගෙවීමේ කාලසටහන් සම්බන්ධ වාර්තා ග්‍රහණය කර ගබඩා කිරීමෙන් ණය සම්පූර්ණයෙන් පියවීමට අදාළව | බැංකුව සුරක්ෂිත ලේඛන වල ආරක්ෂාව තහවුරු කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටින් ස්ථාපිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | බැංකුවට සහතික වීමට ඉඩ සලසයි.සම්පූර්ණ පියවීම මත,බැංකුව විසින් ස්ථාපිත ඔප්පු නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් අදාළ ගණුදෙනුකරුවන්ට ඔප්පු නිකුත් කරනු ඇත. කෙසේවෙතත්, මුල් ඔප්පුව විනාශ වී ඇති හෝ අස්ථානගත වී ඇති අවස්ථාවක ගණුදෙනුකරුගේ එකඟතාවය ලබා ගැනීමෙන් පසු ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය සහ මූලික නීතිඥවරයා වෙත යොමු කර අනුපිටපත් ඔප්පුවක් නිකුත් කිරීම නොවැළැක්විය හැක. | |
| (iii) අස්ථානගත වූ ණය ලිපිගොනු 330 න්, ගංවතුර තත්ත්වය හේතුවෙන් කඩුවෙල ශාඛාවේ ණය ලිපිගොනු 215 ක් හෙවත් සියයට 65 ක් අස්ථානගත වී තිබුණි. ඉන් ණය ලිපිගොනු 31 ක් අක්‍රීය ණය ගණයට අයත් වුණි. මෙම ණයවල මුළු හිඟ ශේෂය රු.මිලියන 10.282 ක් විය. | බැංකුවේ කඩුවෙල ශාඛාවේ ලිපිගොනු විනාශ වීමට හෝ අස්ථානගත වීමට මූලික හේතුව වනුයේ ස්වාභාවික ව්‍යසනයකි. බැංකුව විසින් මෙම ණය අක්‍රීය වීමට පෙර ඔවුන් මූලිකව අමතා අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.අවශ්‍යනම්, පරිගණක පද්ධතියේ ඇති තොරතුරු සහ රඳවා තබා ඇති ලේඛන භාවිතා කරමින් ණය ආපසු අයකර ගැනීමට බැංකුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත. | බැංකුව සුරක්ෂිත ලේඛන වල ආරක්ෂාව තහවුරු කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටින් ස්ථාපිත කළ යුතුය. |
| (iv) ප්‍රධාන කාර්යාල ශාඛාවේ අස්ථානගත වූ ණය ලිපිගොනු සංඛ්‍යාව 21 ක් වූ අතර ඉන් ණය ලිපිගොනු 18 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ පවතී. ඉන් ලිපිගොනු 16 ක් එම ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයකු විසින් සිදු කරන ලද වංචාවකට අදාළ ඒවා වුණි. ණය ලිපිගොනු නොමැතිවීම හේතුවෙන් වංචා සිදු කළ කාර්ය මණ්ඩල සාමාජිකයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ගැටළු සහගත වුණි. | පුද්ගලික ණය 16 ක් සම්බන්ධව වංචා කළ කාර්ය මණ්ඩල සාමාජිකයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතී.කෙසේවෙතත්, ඉහත කී වංචනික ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වූ අලාභයෙන් සියයට 85 ක් දැනටමත් රක්ෂණ වන්දියක් මගින් ආවරණය කරගෙන ඇත.අතිරේකව, විධිමත් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ලිපිගොනු අස්ථානගත වී ඇති අනෙකුත් ණයවල හිඟ ශේෂයන් අයකර ගැනීමට ගෙන ඇත. | කාර්ය මණ්ඩලයේ වංචනික ක්‍රියාකාරකම් වළක්වා ගැනීම සඳහා බැංකුව ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.3.1 ණය ලබාදීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් ප්‍රධානය කර ඇති මුළු දළ ණය සහ අත්තිකාරම් රු.මිලියන 548,898 ක් වූ අතර ඉන් රු.මිලියන 3,800 ක් (ඇ.ඩො. මිලියන 13.08 ) හෝ සියයට 0.69 ක් විදේශ සමාගමකට ප්‍රධානය කර ඇති ණය සහ ඒ සඳහා ලැබිය යුතු උපචිත පොළිය නියෝජනය කරයි.2024 මැයි 31 දිනට මෙම විදේශ ණයෙහි ලැබිය යුතු ශේෂය රු.මිලියන 3,978 ක් විය. | මෙම විදේශ මුදල් ණය මුදල වර්තමානයේ අක්‍රීය කාණ්ඩයේ ඇත.අයකිරීමේ ක්‍රියාකාරකම් වර්තමානයේ සිදු කෙරෙමින් පවතින අතර (ආ) හි දක්වා ඇත.<br>2023 මූල්‍ය වර්ෂයේදී ඇ.ඩො. (USD) අරමුදල් සඳහා එක් යෝජනාවක් බැංකුවට ලැබිණි.(වටිනාකම ඇ.ඩො.මිලියන 2.5) කෙසේවෙතත්,බැංකුවට ලාභ ලැබිය හැකි අරමුදල් සඳහා උද්ධෘත පොලී අනුපාතිකය ඉතා අඩු බැවින් මෙම පහසුකම ක්‍රියාත්මක නොවීය.<br>බැංකුව, සංවිධානය කරන්නන් සහ අනෙකුත් බැංකු හරහා ඇ.ඩො. වලින් ණය ලබා දීමට කැමැත්ත පළ කර ඇති අතර වර්තමානයේ හැකි අවස්ථා පිළිබඳව විමසිල්ලෙන් සිටී. | බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ආයතනික ණයවල මුළු හිඟ ශේෂය රු. මිලියන 80,202.94 ක් වූ අතර ඉන් රු. මිලියන 5,955.57 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුණි. මෙම මුළු හිඟ ශේෂය 2024 මැයි මස අවසානයේදී රු. මිලියන 79,941 දක්වා අඩු වී ඇති අතර ඉන් රු. මිලියන 5,933 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි. ඉහත අක්‍රීය ණය ශේෂයෙන් සියයට 67 ක් විදේශ ණය නියෝජනය කරන අතර සියයට 29 ක් භාණ්ඩාගාර ඇපකර මගින් සුරක්ෂිත කර ඇති රජයට සම්බන්ධ සමාගම් දෙකකට ලබා දුන් ණය නියෝජනය කරයි. | අක්‍රීය ආයතනික ණය සම්බන්ධයෙන් බැංකුව විසින් ගෙන ඇති අයකිරීමේ ක්‍රියාමාර්ග.<br>විදේශ ණය (ආයතනික අක්‍රීය ණය වලින් සියයට 67) -<br>ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීමට සාකච්ඡා කරමින් පවතී.ණය ගැණුම්කරු ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර ඇති අතර අදාළ නියමයන් සහ කොන්දේසි ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුව (සම්මේලික හවුල්කරු) වෙත යොමු කර ඇත.<br>රජයේ ඇපකරයක් මගින් සුරක්ෂිත කර ඇති රුපියල් ණය-<br>නිවැරදිකිරීම් - ඇත්තේ එකක් පමණි.<br>භාණ්ඩාගාර ඇපකර මගින් සුරක්ෂිත කර ඇති රජයට සම්බන්ධ සමාගම් වලට ලබා දී ඇති වර්තමානයේ අක්‍රීය කාණ්ඩයේ ණය නමින්,ටෙක්නෝපාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ්. බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජාතික ජල සම්පාදන සහ ජලපවහන | බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සහ අක්‍රීය ණය අවම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |

මණ්ඩලයෙන් අයවිය යුතු හිඟ වාරික 2023 දෙසැම්බර් මාසයේදී පියවීම සිදු කරන ලද අතර පහසුකම තවදුරටත් අක්‍රීය කාණ්ඩයේ නොපවතී.

ටෙක්නෝපාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් සම්බන්ධයෙන් ගත් අයකිරීමේ ක්‍රියාමාර්ග

- බැංකුව ටෙක්නෝපාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් හි සභාපති වෙත හිඟ ශේෂය පිළිබඳ සිහිකැඳවීම් කිහිපයක් යවා ඇත.
- මුදල් අමාත්‍යාංශයෙන් කළ විමසීමකදී (පහසුකම් පිළිබඳ ඇපකරු) සමාගම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ගැසට් කර ඇති බවත්, පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩලය සහ සභාපතිවරයා ක්‍රියාත්මක නොවන බවත් බැංකුවට දන්වා ඇත.
- මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ මඟ පෙන්වීම යටතේ,රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023.06.21 දිනැති ලිපිය මගින් බැංකුවට දන්වා සිටියේ මෙම කාරණය ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශෙය් ලේකම් වෙත යොමු කර ඇති බවයි.
- බැංකුව විසින් ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතා අදාළ නිලධාරීන් සමඟ මේ පිළිබඳ සාකච්ඡා කිරීමට රැස්වීමක් ඉල්ලා සිටින ලදී.
- බැංකුව විසින් 2024.02.20 වන දින ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ

අධ්‍යක්ෂ ජනරාල් වෙත සිහිකැඳවීමේ ලිපියක් යවන ලද අතර,2024.03.11 වන දින අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳවන ලදී.සමාගමේ අධීක්ෂණය සඳහා අන්තර්වාර සභාපතිවරයෙකු පත් කර ඇති බව එහිදී දන්වා ඇත.කුරුණෑගල තාක්ෂණ උද්‍යානය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා සම්බන්ධ කර විදේශ ආයෝජකයින්ට ව්‍යාපෘතියට අරමුදල් ආයෝජනය කිරීමට ආරාධනා කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවද දන්වා සිටින ලදී.

- කල්ඉකුත් වූ ගෙවීමට ඇති ශේෂයන් ගේ තත්ත්වය බැංකුව දැනුම්දුන් අතර එය කඩිනමින් විසඳා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.ටෙක්නෝ පාර්ක් හි අනාගතය සම්බන්ධයෙන් විසඳුමකට පැමිණ නිශ්චිත වැඩ පිළිවෙලක් සකසන තුරු අතුරු කාල සීමාවේ දී හිඟ මුදල් පියවීමට මුදල් අමාත්‍යාංශය සහ සමාගමේ නිලධාරීන් සමඟ තවදුරටත් සාකච්ඡා කිරීමට තීරණය විය.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගයට අනුව බැංකුව 2024.07.04 දිනැති ලිපියෙන් ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සහාය මෙම කාරණය විසඳීමට ඉල්ලා සිටින ලදී.ඊට පිළිතුරු වශයෙන් 2024.07.23 දිනැති ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පිළිතුරු ලිපියෙන් දන්වා සිටියේ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මෙම කාරණය රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ

ජනරාල් වෙත යොමු කර ඇති බවයි.

(ඇ) 2024 මැයි 31 දිනට බැංකුව විසින් ලබා දී ඇති රු. මිලියන 5 කට වැඩිණයවල හිඟ ශේෂය රු. මිලියන 24,566 ක් විය. මුළු හිඟ මුදලින් රු. මිලියන 22,835 ක් හෙවත් සියයට 93 ක් ශාඛා හරහා ප්‍රදානය කර තිබූ අතර ඉතිරි සියයට 7, ණය අංශය හරහා ප්‍රදානය කර තිබුණි. 2024 මැයි 31 දිනට මිලියන 5 කට වැඩි පිරිසෙන් ණය, රු.මිලියන 7,864 ක් සහ රු.මිලියන 1,380 ක් පිළිවෙලින් ශාඛා සහ ණය අංශය හරහා ප්‍රදානය කරන ලද ණය අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි.

බැංකුව පහත දැක්වෙන ගණුදෙනුකරුවන්ට එදිරිව පරාටේ නීතිය ආරම්භ කිරීම සහ පරාටේ නීතිය රජය විසින් අත්හිටුවීම හේතුවෙන් 2024/12/15 තෙක් තාවකාලිකව නියෝගයන් රඳවා තබා ගැනේ.

| ණය අංකය | වටිනාකම (රු..) මිලියන | මණ්ඩල අනුමැතිය/ CC අනුමැතිය ලබාගත් දිනය |
|---|---|---|
| 603086293217 | 20.00 | 27/03/2024 |
| 603086192076<br>603086223216<br>603086192088 | 43.16 | 22/03/2024 |
| 600020066379 | 16.00 | 20/02/2024 |
| 600670027840 | 20.05 | 22/03/2024 |
| 600630037332 | 6.5 | 22/03/2024 |
| 600240020355 | 17.7 | 22/03/2024 |
| 603086247060 | 12.6 | වෙන්දේසි දිනය:18/01/2024 (රැඳී සිටීමේ නියෝගය) |
| 603086271300 | 7.5 | 26/09/2023 |
| 603086199176 | 6.5 | 05/03/2024 |
| 603086198761<br>603086223230 | 13.6 | 22/03/2024 |
| 603086296961<br>603086296973 | 9.7 | 12/02/2024 |
| 603086275201 | 21.37 | 22/02/2024 |
| 603086264063<br>603086264013<br>603086303876 | 41.46 | 27/03/2024 |

බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගැයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සහ බැංකුවේ අක්‍රීය ණය ශේෂය අවම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

(ඇ) 2020 දෙසැම්බර් 23 දින බැංකුව විසින් රු.මිලියන 164.73 ක බද්ධ දේපල ණයක් ලබා දී තිබුණි.ණය ගැණුම්කරු වාරික දෙකක් පමණක් ගෙවා තිබුණු අතර 2023 මැයි 31 දින වන විට රු.මිලියන 39.363 ක් වූ වාරික 27 ක් ගෙවා නොතිබුණි. 2024 පෙබරවාරි 06 දිනට මුළු හිඟ ණය ශේෂය රු.මිලියන 222.381 ක් විය.මෙම දේපළ 2024 පෙබරවාරි 06 වන දින පැවති වෙන්දේසියෙන් පසුව බැංකුව වෙත පවරාගෙන තිබුණි.කෙසේවෙතත්,2024 ජූලි 04 දිනැති තක්සේරු වාර්තාවට අනුව ඉඩමේ වෙළඳපොළ වටිනාකම රු.මිලියන 197.4 ක් විය.එහෙත්,ඉතිරි

මෙම ණය මුදල නිවාස සහ දේපළ කාණ්ඩය යටතේ පුද්ගලයින් දෙදෙනෙකුට ලබා දෙන ලදී.ණය ගැණුම්කරුවන්ට ක්‍රමවත්ව ගෙවීම් කිරීමට නොහැකි වූ අතර බැංකුව විසින් ණය මුදල අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත.දේපළෙහි තක්සේරුව පිළිබඳ විස්තර පහතින් සඳහන් කර ඇත.

| දිනය | වෙළඳපොල වටිනාකම(රු.) | විකුණුම් වටිනාකම (රු.) | තක්සේරුකරුගේ නම |
|---|---|---|---|
| 14/10/2020 | 195,610,000 | 190,000,000 | ටී එම් බී තෙන්නකෝන් මයා |
| 10/11/2020 | 218,000,000 | 210,000,000 | ටී බී බාලසූරිය මයා |
| 17/12/2020 | 197,800,000 | 196,500,000 | අයි කේ රාජපක්ෂ මිය |
| 04/07/2020 | 197,400,000 | 180,000,000 | යූ ආර් සිල්වා මයා |

දේපළෙහි වෙළඳපල වටිනාකම සැලකිල්ලට ගනිමින් නියම කළ මිල මිල තීරණය කරන ලදී.2024.01.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ,ආපසු

බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගැයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සහ බැංකුවේ අක්‍රීය ණය ශේෂය අවම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| | හිඟ ශේෂය වන රු.මිලියන 24.981 අයකර ගැනීම අවිනිශ්චිතය. | අයකරගත හැකි මුදල නියම කළ මිලට වඩා වැඩි වුවද වෙන්දේසියක් මගින් දේපළ විකිණීම සඳහා නියම කළ මිල රු.මිලියන 198 ක් ලෙස නියම කිරීමට අනුමැතිය ලබා දී ඇතබැංකුව විසින් 2024.02.06 වන දින දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කර ඇත .කෙසේවෙතත්,අනාගත ගැණුම්කරුවන් පැමිණ සිටියේ නැත.එබැවින් දේපළ බැංකුවට පවරාගෙන ඇත.බැංකුව විසින් දේපළ නැවත විකිණීම සඳහා 2024.08.02 වන දින ටෙන්ඩර් දැන්වීම් ප්‍රකාශයට පත් කරන ලද අතර දේපළ මිලට ගැනීමට සිටියේ එක් ගැණුම්කරුවකු පමණි. | |
| (ඉ) | බැංකුව සහ මහජන බැංකුව විසින් 2018 ජූනි 14 දින ආර් පී අයි (RPI) ප්‍රයිවට් ලිමිටඩ් නැමති මාලදිවයින් සමාගමකට එ.ජ.ඩො.මිලියන 10 ක සමෝදානික ණයක් (Syndicated Loan)ලබා දී තිබුණි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුළු ණය මුදලින් සියයට 90 ක් වන එ.ජ.ඩො.මිලියන 9 ක දායකත්වයක් ලබා දී තිබුණි. ණය ගැණුම්කරු විසින් 2024 මැයි 31 වන දිනට කිසිදු ප්‍රාග්ධන ආපසු ගෙවීමක් හෝ එ.ජ.ඩො මිලියන 4.18 ක්වූ හිඟ පොලී ගෙවා නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) | ඉහත කී ණය මුදල සංචාරක කර්මාන්තය යටතේ ක්‍රියාත්මක වන විදේශීය සමාගමකට ඉදිකිරීම් කටයුත්තක් සඳහා ලබා දී තිබූ අතර මෙය ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ දක්වා ඇති විෂය පථය යටතේ ආවරණය නොවේ. | ජාතික ඉතිරිකිරීමේ බැංකුපනතේ 6 (ජී) වගන්තියට අනුව, අනෙකුත් බැංකු සහ මූල්‍ය ආයතන සමඟ සමෝදානික ණය(Syndicated Loan) සඳහා සහභාගී වීමට බැංකුවට බලය ඇත.<br>තවද, ණය ලබාදීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහ බැංකුවේ නීති අංශයෙන් අවශ්‍ය නීතිමය නිෂ්කාශනය ලබාගෙන ඇත. | ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ දක්වා ඇති විෂය පථය තුළ සමෝදානික ණය (Syndicate loan) සඳහා බැංකුව සහභාගී විය යුතුය. |
| (ii) | ණය ලබාදීමට පෙර බැංකුව විස්තීරණ ණය ඇගයීමක් හෝ අවදානම් තක්සේරුවක් කර තිබේද යන්න සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නිරීක්ෂණය නොවීය. | ඇගයීම:<br><u>රටේ සහ ආංශික අවදානම</u><br>සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ විස්තර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මාලදිවයිනේ ආර්ථිකය පිළිබඳ අදහසක් ලබා ගැනීම සඳහා බැංකුව | මේ ආකාරයේ පහසුකමක් ලබාදීමට පෙර බැංකුව විසින් විස්තීරණ ණය ඇගයීමක් සහ අවදානම් ඇගැයීමක් |

| | | |
|---|---|---|
| | මාලදිවයිනේ මුදල් අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාසික ආර්ථික සමාලෝචන පරීක්ෂා කර ඇත.ඒ අනුව, මාලදිවයිනේ මූල්‍ය අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාසික ආර්ථික සමාලෝචනවල ප්‍රකාශයට පත් කරන ලද දත්ත සමඟ මූල්‍ය පුරෝකථනයන්හිදී භාවිතා කරන ලද පදිංචි කාලය වැනි උපකල්පනවල සාධාරණත්වය පරීක්‍ෂා කර ඇත. තවද, ඇතැම් හෝටල් වෙබ් අඩවිවල ප්‍රකාශිත සහ ට්‍රිප් ඇඩ්වයිසර් වැනි මූලාශ්‍රවලින් මාලදිවයිනේ මේ හා සමාන හෝටල්වල කාමර ගාස්තු සංසන්දනය කරමින් ඇගයීම සිදු කර ඇත. ස්වාධීන ඇගයීම සිදු කිරීමේදී බැංකුව විසින් මෙම කරුණු සලකා බලා ඇත.<br><u>නීති අවදානම</u><br>නීතිමය අවදානම ආවරණය කිරීම සඳහා බැංකුවේ නීති අංශයෙන් අවශ්‍ය නිෂ්කාශන ලබා ගෙන ඇත | සිදු කළ යුතුය. |
| (iii) පශ්චාත් ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ සාමාන්‍යාධිකාරීවරයාගේ අංක 1641/2015 චක්‍රලේඛයට අනුව, ණය අනුමත කර මාස 3 ක් ඇතුළත බැංකුව ණය පහසුකම් සමාලෝචනය කර නොමැත. | ආයතනික මූල්‍ය අංශය විසින් අදාළ ණය ලිපිගොනු සහ ඊට අදාළ අනෙකුත් සුරැකුම් ලියකියවිලි අවදානම් කළමනාකරණ අංශය වෙත පහත දිනවලදී යොමු කර ඇත.<br>2018/08/27, 2018/11/19, 2019/02/07, 2019/04/09, 2019/07/10, 2019/10/18, 2019/10/23, 2019/11/13 | බැංකුවේ අවදානම් අංශය චක්‍රලේඛ උපදෙස් අනුව සාධාරණ කාල සීමාවක් තුළ ණය සමාලෝචනය කළ යුතුය. |
| (iv) පළමු ණය ලබා ගත් 2018 ජුනි 21 දින සිට බැංකුව විසින් ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා වසරක මූලික සහන කාලයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, හේතු කිහිපයක් සඳහන් කරමින් ප්‍රාග්ධන සහ පොලී ආපසු ගෙවීම සඳහා මූලික සහන කාලය 2018 ජුනි සිට 2022 ජුනි දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. | ව්‍යාපාර අඩාලවීම් සහ ඉදිකිරීම් ප්‍රමාදයන් කෙරෙහි ඇති කළ බලපෑම් ඇතුළු හේතු කිහිපයක් සටහන් කරමින් සේවාලාභියා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනිමින් මූලික සහන කාලය දිර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. | බැංකුවට සිදුවිය හැකි අලාභ අවම කර ගැනීමට තීරණ ගත යුතුය. |
| (v) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2020 අංක 5 දරන චක්‍රලේඛය යටතේ | 2020 මැයි 14 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අදාළ |

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත ව්‍යාපෘතිය සඳහා ප්‍රමාද සහනයක් (Moratorium Facility) ලබා දී තිබුණද, ණය ගැණුම්කරු විදේශිකයෙකු බැවින් මෙම ණය ඉහත සඳහන් චක්‍රලේඛයේ විෂය පථයට අයත් නොවේ.

පිළිතුරට අනුව, ගනුදෙනුකරුගේ ඉල්ලීම් මත මෙවැනි පහසුකමක් සඳහා කිසියම් සහනයක් ලබා දීම බැංකුව විසින් ගනු ලබන ව්‍යාපාරික තීරණයකි.ඒ අනුව, සේවාදායකයා විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව ප්‍රමාද සහනයක් (Moratorium Facility) ලබා දෙන ලදී.

නියෝග සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීම අවශ්‍ය වේ.

(vi) 2021 ජූලි මාසයෙන් පසු කාලය සඳහා රක්ෂණ ආවරණය බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

රක්ෂණ ඔප්පුව අලුත් කර ඉදිරිපත් කිරීමට සේවාලාභියාට සිහි කැඳවීම් 2023.07.24 යවා ඇත.අලුත් කළ රක්ෂණ ඔප්පුව තවම ලැබී නැත.

කලානුරූපීව රක්ෂණ ආවරණය අලුත් කිරීම පිළිබඳව බැංකුව විසින් අධීක්ෂණය කර පසුවිපරම් කළ යුතුය.

(vii) ණය ගිවිසුමට අනුව, එ.ජ. ඩො.270,000 ක අවම වටිනාකමක් සහිතව බැංකුවක ණය සේවා සංචිත ගිණුමක් (Debit Service Reserve Account – DSRA) විවෘත කර පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, ණය සේවා සංචිත ගිණුමෙහි (DSRA) අවම ශේෂය ණය ගැණුම්කරු (RPI) විසින් නඩත්තු කර නොතිබූ අතර 2024 මැයි 31 දිනට එම ගිණුමේ ශේෂය එ.ජ.ඩො. 27,533.53 ක් විය.

ණය සේවා සංචිත ගිණුමේ (DSRA) අවම ශේෂය දක්වා ප්‍රතිපූරණය කරන ලෙස RPI වෙතින් අවස්ථා කිහිපයකදී ඉල්ලා ඇත. ණයප්‍රමාද වූ විට අයවිය යුතු මුදල් අයකර ගැනීමට මෙම ගිණුමේ ඇති ශේෂය යොදා ගෙන ඇත.
ණය සේවා සංචිත ගිණුම හරහා වාරික පියවීම පහත පරිදි විය.

| අයකරගත් දිනය | වටිනාකම(එ.ජ. ඩො) | වාරිකය |
|---|---|---|
| මැයි 2019 | 72,647.42 | මාර්තු 2019 |
| මැයි 2019 | 78,974.62 | අප්‍රේල් 2019 |
| මැයි 2019 | 76,558.58 | මැයි 2019 |
| ජනවාරි 2023 | 13,004.76 | දඩ පොලිය |

ණය ගිවිසුම් අවශ්‍යතාවයට අනුව ණය සේවා සංචිත ගිණුම (DSRA) ගොඩනැගීම පිළිබඳව බැංකුව විසින් අධීක්ෂණය කළ යුතුය

(viii) ණය ගිවිසුමට අනුව, ණය දෙන්නන් විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ස්වාධීන ව්‍යාපෘති නිලධාරියෙකු ලෙස හෝටල් ඉදිකිරීම් පිළිබඳ සුදුසුකම් ලත් විශේෂඥයෙකු පත් කළ යුතුය. කෙසේ වෙතත්, ණය දෙන්නන් එවැනි පුද්ගලයෙකු පත් කර නොතිබූ අතර ආර්පීඅයි පුද්ගලික සමාගම විසින් එනම් ණය ගැණුම්කරු විසින් පත් කර ඇති වරලත් ප්‍රමාණ මිනින්දෝරුවරයාගේ (Chatered quantity Serveyor) ප්‍රගති

මෙවැනි ස්වභාවයේ ව්‍යාපෘතියක ප්‍රගති වාර්තාවක් සැපයීමට අවශ්‍ය සුදුසුකම් සහිත වෘත්තිකයකු වන මොහොමඩ් සෝලා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා සමඟ ඉදිරියට යාමට සමෝධානික (Syndicated) ණය දෙන්නන් දෙදෙනාම (ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුව) තීරණය කර ඇත.

බැංකුව විසින් ණය ගැණුම්කරු විසින් පත් කරන ලද මිනින්දෝරු මත යැපීමෙන් තොරව ණය ගැණුම්කරුගෙන් ස්වාධීන වන සුදුසුකම් ලත් විශේෂඥයෙකු පත් කර තිබිය යුතුය.

| | | | |
|---|---|---|---|
| | වාර්තාව මත විශ්වාසය තබා තිබුණි. | | |
| (xi) | පවතින තොරතුරුවලට අනුව, ස්වාධීන පාර්ශ්වයක් හෝ සිවිල් ඉංජිනේරුවන් වැනි අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ නිපුණතා ඇති නිලධාරීන් විසින් කිසිදු වැඩබිම් පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. මෙම ඉදිකිරීම පරීක්ෂා කිරීමට අවශ්‍ය නිපුණතා ඇති දක්ෂ නිලධාරීන් බැංකුවේ සිටියද, ඉදිකිරීම්වල ගුණාත්මකභාවය සහ නිමවීම පිළිබඳව තාක්ෂණික දැනුමක් නොමැති ණය අංශයේ නිලධාරීන් විසින් බැංකුව වෙනුවෙන් වැඩබිම් පරීක්ෂාවක් සිදු කර තිබුණි. | එය ආයතනික මූල්‍ය අංශයේ සාමාන්‍ය පරිචය වන අතර ණය නිලධාරීන් විසින් වැඩබිම් පරීක්ෂාව සහ වාරක පරීක්ෂාව සිදු කෙරේ.කළමනාකාරීත්වයේ උපදෙස් අනුව , වැඩබිම් පරීක්ෂාව සහ වාරක පරීක්ෂාව ආයතනික මූල්‍ය අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.බැංකුව විසින් ස්වාධීන පාර්ශවයක් වැඩබිම් පරීක්ෂාව සහ වාරක පරීක්ෂාවන් සඳහා යොදාගත් අවස්ථාවක් මින් පෙර වාර්තා වී නොමැත. | අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ නිපුණතා ඇති නිලධාරීන් විසින් වැඩබිම් පරීක්ෂා කිරීම සිදු කළ යුතුය. |
| (x) | 2022 ජූලි 04 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක 207/2022 අනුව, ආර්පීඅයි ප්‍රයිවට් ලිමිටඩ් හි සියලුම හිඟ මුදල් ආපසු අයකර ගැනීම සඳහා වඩාත්ම විචක්ෂණශීලී පිරිවැය ඵලදායී සහ කඩිනම් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සඳහා නීති, ඉංජිනේරු, මූල්‍ය සහ නියාමන, ණය ආදී විවිධ දෘෂ්ටිකෝණවලින් ආර්පීඅයි පහසුකම පිළිබඳ ඉහළ මට්ටමේ සමාලෝචනයක් සිදු කිරීම සඳහා ස්වාධීන උපදේශකයෙකු පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.<br>• අංක 288/2022දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව, රු. මිලියන 9.684 ක සැලකිය යුතු සේවයේ යෙදීමේ ගාස්තුවක් යටතේ එම පැවරුම ඉටු කිරීම සඳහා ශ්‍රී | සේවා ගිවිස ගැනීමේ ලිපියට අනුව පහත ගෙවීම් ව්‍යුහයට එකඟ විය.<br>සේවා ගිවිස ගැනීමේ ලිපිය අත්සන් කිරීමෙන් පසු - 50% (රු. 4,842,200.00)<br>කෙටුම්පත් වාර්තාව නිකුත් කිරීමෙන් පසු - 25% (රු. 2,421,100.00)<br>අවසාන වාර්තාව නිකුත් කිරීමෙන් පසු - 25% (රු. 2,421,100.00)<br><br>බැංකුව මේ දක්වා පහත ගෙවීම් සිදු කර ඇත:-<br>මූල්‍ය හා තාක්ෂණික වෘත්තීය සේවාවලින් 75%.<br>නීති සහ බදු වෘත්තීය සේවාවලින් 50%<br>• මුලදී ස්වාධීන තක්සේරුකරුවන් 14.11.2022 සිට 17.11.2022 දක්වා ආර් පී අයි පරිශ්‍රයට පිවිසීමට සැලසුම් කර ඇත. ආර් පී අයි වෙතින් ප්‍රතිචාරයක් නොලැබීම නිසා මෙය ප්‍රමාද විය. ඉන් අනතුරුව, ස්වාධීන තක්සේරුකරුවන් විසින් 2023.01.03 සිට 2023.01.04 දක්වා කාලය තුළ ආර් පී අයි පරිශ්‍ර පරීක්ෂාව සිදු කරන ලදී. | බැංකුව ණය ලබා දීමට පෙර ණය ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කළ යුතුය. අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා පිරිවැය ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. බැංකුවේ වගකීමක් ලෙස ඉල්ලා සිටින සියලුම තොරතුරු සැපයීම අවශ්‍ය වේ. |

ලංකාවේ ගෝලීය ගිණුම්කරණ සමාගමක් පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. එම සේවයේ යෙදීමේ ගාස්තුවෙන් සියයට 75ක් බැංකුව විසින් දැනටමත් ගෙවා තිබුණි.

- ඉහත ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සේවයේ යෙදී සිටීමේ දින සිට සති හයක් ඇතුළත ලබා දීමට එම ගිණුම්කරණ ආයතනය එකඟ වී තිබුණි . කෙසේ වෙතත්, ඉල්ලීම් කිහිපයක් තිබියදීත්, එම වාර්තාව 2024 මැයි 31 වන විගණන දිනය දක්වා විගණක සමාලෝචනය සඳහා ලැබී නොතිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) 2023 අගෝස්තු 31 දින දන්වා ඇත්තේ බැංකුව එම වාර්තාව විගණනයට නිකුත් කිරීම සඳහා නීතිපතිවරයාගෙන් උපදෙස් සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් උපදෙස් ලබා ගන්නා බවයි.
- ආර් පී අයි ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය, නීතිමය සහ නියාමන රාමුව සහ මෙම ණයහි හිඟ මුදල අයකර ගැනීමේ වඩාත් විචක්ෂණ ක්‍රම හඳුනාගැනීම සඳහා එම වාර්තාවෙන් බැංකුවට කිසියම් සහයෝගයක් ලැබී තිබේද යන්න තහවුරු කිරීමට විගණනයට සාක්ෂි නොවිය.
- 2022.11.04 දිනැති ලිපිය මගින් බැංකුව PWC විසින් ඉල්ලා සිටින ලියකියවිලි සපයන ලෙස ආර් පී අයි ආයතනයෙන් ඉල්ලා සිටියේය.
- 2024.03.09 දිනැති ලිපිය මගින් බැංකුව විසින් ඓතිහාසික මූල්‍ය වාර්තා, ව්‍යාපෘති පුරෝකථන සහ ප්‍රගති වාර්තා සහ ප්‍රාග්ධන වියදම්වල අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් සහ ප්‍රධාන කල්බදු ගෙවීම් සම්බන්ධ ලිපි හුවමාරුව මෙන්ම අනාගත ආයෝජකයින් සමඟ සිදු කරන ලද සාකච්ඡාවලට අදාළ වත්මන් ප්‍රගතින් සහ වෙනත් ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා විගණකවරුන්වෙත ප්‍රවේශය ලබා දෙන ලෙස ආර් පී අයි වෙත දැනුම් දී ඇත.
- ඉහත ඉල්ලීම සඳහා ආර් පී අයි වෙතින් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි.
- 2023.04.04 දිනැති ලිපිය මගින්, PWC විසින් මූල්‍ය සහ බදු සහ නීතිමය සහ නියාමන වාර්තා කෙටුම්පත ඉදිරිපත් කළ අතර ආර් පී අයි විසින් තීරණාත්මක තොරතුරු ලබා නොදීම නිසා PWC හට මූල්‍ය හා බදු සමාලෝචනය සම්පූර්ණ කිරීමට නොහැකි වූ බව දැනුම් දෙන ලදී.
- මෙම ලේඛන නිකුත් කිරීම සම්බන්ධයෙන් ගරු නීතිපති වෙතින් බැංකුවට නිශ්චිත ප්‍රතිචාරයක් ලැබී නැත.
- 2024.03.11 දිනැති ලිපිය මගින් ගරු. නීතිපතිවරයා විකල්ප හතරක් සහිතව ආර් පී අයි වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් බැංකුවට උපදෙස් දී ඇත. වැඩිදුර උපදෙස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. 2024.05.03

දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව අනුව I විකල්පය තෝරාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

- මේ අතර 2024.05.22 දිනැති ලිපිය මගින් බැංකුව ස්වාධීන මූල්‍ය හා බදු සමාලෝචන, තක්සේරු වාර්තාව සහ නෛතික හා නියාමන සමාලෝචනයෙන් ලබාගත් තොරතුරු ගරු. නීතිපති වෙත යවන ලදී.

- 2024.08.08 දිනැති ලිපිය මගින් ගරු. නීතිපතිවරයා බැංකුව විසින් ලබා දී ඇති එම තොරතුරු මත පදනම්ව බැංකුවට තවදුරටත් උපදෙස් ලබා දී ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි, මෙම කාරණය නිත්‍ය හවුල්කරුවෝ (Nithya Partners) නම් නීති සමාගම වෙත යොමු කර ඇති අතර, මූලික උපදේශනය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහභාගීත්වයෙන් 2024.08.12 දින පවත්වන ලදී. පසුව අදාළ ලියකියවිලි වැඩිදුර උපදෙස් සඳහා 2024.08.14 දිනැති ලිපියක් මගින් නිත්‍ය හවුල්කරුවෝ (Nithya Partners) වෙත යොමු කරන ලදී.

- තක්සේරු වාර්තාවෙන් උපුටා ගන්නා ලද තොරතුරු සහ නීතිමය සහ නියාමන සමාලෝචනය තොරතුරු ඉදිරිපත් කර ඇත.

(ඊ) බැංකුව විසින් 2019 සැප්තැම්බර් 23 වැනි දින මොහොමඩ් සියාම් අහමඩ් සහරාන් (ණය අංකය-603086247060) වෙත රුපියල් මිලියන 12.6 ක ණය මුදලක් ලබා දී ඇත. 2024 මැයි 31 දිනට හිඟ ශේෂය සහ මුළු හිඟ මුදල් රු. මිලියන 12.930 ක් සහ පිළිවෙළින් රු.

| | | |
|---|---|---|
| මිලියන 7.664 කි. ඉහත ණය මුදල ලබා දී ඇත්තේ නිවසක් සහ දේපලක් මිලදී ගැනීමටය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) ප්‍රධාන විධායක චක්‍රලේඛ අංක 955/2018 හි 3 වන සංශෝධනයට අනුව, රුපියල් මිලියන 12 කට වැඩි ණය සඳහා ණය කමිටුව විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත රුපියල් මිලියන 12.6 ක ණය මුදල අනුමත කර ඇත්තේ සහකාර සාමාන්‍යාධිකාරී (AGM) (ණය) විසින් පමණි. | ප්‍රධාන විධායක චක්‍රලේඛ අංක 955/2018 හි 3 වන සංශෝධනයට අනුව, "ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල ණය රේඛා නිලධාරීන්ගේ අධිකාරී සීමාවන්ට ශාඛාවල අක්‍රීය ණය අනුපාත බලපාන්නේ නැත." ඒ අනුව, මෙම ණය ගොනුව ප්‍රධාන විධායක චක්‍රලේඛ අංක 955/2018 අනුව සහකාර සාමාන්‍යාධිකාරී (ණය) විසින් අනුමත කල හැකි රු. මිලියන 15 සීමාවට යටත්ය. | බැංකුව විසින් පනවා ඇති නියෝජිත අධිකාරියේ සීමාවන්ට අනුකූල වීම බැංකුව විසින් සහතික කළ යුතුය. |
| (ii) සහකාර සාමාන්‍යාධිකාරී (ණය) මෙම ණය ගැණුම්කරුගේ ණය තොරතුරු කාර්යාංශ තත්ත්ව වාර්තාවේ දක්වා ඇති ණය පහසුකම් 10 ක අක්‍රමවත් ප්‍රති-ගෙවීම් සැලකිල්ලට නොගෙන මෙම ණය අනුමත කර ඇත | කෙසේ වෙතත්, ණය තොරතුරු කාර්යාංශ තත්ත්ව වාර්තාවේ ඉතිහාසය අක්‍රමවත් බැවින් ණය ආපසු ගෙවීම සමීපව නිරීක්ෂණය කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) විසින් උපදෙස් ලබා දී ඇත. | බැංකුවේ ණය ප්‍රතිපත්තියට අනුව ණයක් ලබා දීමට පෙර බැංකුව විසින් ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ තත්ත්වය තක්සේරු කළ යුතුය. |
| (iii) සහරාන් එන්ටර්ප්‍රයිසස් විසින් ණය ලබා ගැනීමේදී 2017 අගෝස්තු 10 දිනැති ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංක WA/11923 ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ සහ විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් සැපයීම සහ භාෂා ගනුදෙනු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය යටතේ මෙම ව්‍යාපාරයට අදාළ කිසිදු ව්‍යාපාර ලියාපදිංචියක් විගණනයට නිරීක්ෂණය නොවීය. | 2017.08.10 දින බස්නාහිර පළාත - පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද "සමාගමක් ලියාපදිංචි කිරීමේ සහතිකය" පරිවර්තනයේ පිටපතක් පාරිභෝගිකයා විසින් සපයා ඇත. මෙය සත්‍ය පිටපතක් ලෙස සාම විනිසුරුවරයෙකු වන පී. අලගන මහතා විසින් සහතික කර ඇත. (Reg. අංක 09/3/nm /uos/188). | නිසි ලෙස ස්ථාපිත ව්‍යාපාර සඳහා පමණක් බැංකුව ණය ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | මෙම ණය ගැණුම්කරු 2024 මැයි 31 වන විට එක් වාරිකයක් (01) පමණක් ගෙවා තිබූ අතර 2022 ජූලි 19 වන දින සහකාර සාමාන්‍යාධිකාරි (අය කිරීම්) මගින් දේපල වෙන්දේසි කිරීම පිළිබඳ අවසන් දැන්වීම ණය ගැණුම්කරු වෙත යවා තිබුණි. බැංකුව පරාටේ (Parate) ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කළ විට, වෙන්දේසිය වැළැක්වීම සඳහා 2023 ජනවාරි 18 දින ගනුදෙනුකරු විසින් වාරණ නියෝගයක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට බැංකුව අපොහොසත් වී ඇත | මෙම ණය ආපසු අයකර ගැනීම සඳහා බැංකුව කඩිනම් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. ණය ආපසු අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.<br>• පවතින ශේෂයන් පිළිබඳව පාරිභෝගිකයාට දුරකථනයෙන් දැනුම් දීම.<br>• පළමු සිහිකැඳවීම 17/01/2020 යවන ලදී.<br>• දෙවන සිහිකැඳවීම 28/01/2020 දින යවන ලදී.<br>• අවසන් නිවේදනය 2020/02/13 දින යවන ලදී.<br>• 2020/03/05 දින දේපල වෙත පිවිසීම.<br>• ඉල්ලුම් ලිපිය 2020/12/02 දින සේවාදායකයා වෙත යවන ලදී.<br>• නීති නිලධාරියා විසින් 2021/01/29 දින දේපල ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකිණීම සම්බන්ධයෙන් සේවාදායකයා වෙත අවසන් දැන්වීම යවා ඇති අතර ලිපිය නැවත බැංකුව වෙත යොමු කර ඇත.<br>• පසුව, ණය ගැණුම්කරු අමතා අවසන් දැන්වීම 2021/03/16 දින ඔහුගේ ලේකම් වෙත භාර දෙන ලදී.<br>• ප්‍රසිද්ධ වෙන්දේසිය 2023/01/19 දිනට නියමිත විය.<br>• 2023/01/18 දින වෙන්දේසිය තාවකාලිකව අත්හිටුවීමට පාරිභෝගිකයා අත්හිටුවීමේ නියෝගයක් ගෙන ඇත.<br>• කෙසේ වෙතත්, අධිකරණය විසින් නිකුත් කරන ලද තහනම් නියෝගය හේතුවෙන් එය තාවකාලිකව නතර කර ඇත.<br>• ස්ථායි නියෝගයට එරෙහි විරෝධතා 2023/06/21 දින ගොනු කරන ලදී. නඩුව 2024/01/09 දින කැඳවූ අතර බැංකුවට පක්ෂව | මෙම ණය ආපසු අයකර ගැනීමට බැංකුව විසින් ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නියෝගය ලබා දෙන ලදී.<br>• පැමිණිලිකරු (එම් එස් ඒ සහරාන් මහතා) ඉල්ලා සිටි අතුරු තහනම් නියෝගය උගත් දිසා අධිකරණ විනිසුරුවරයා විසින් ප්‍රතික්ෂේප කර ඇත.<br>• පූර්ව නඩු විභාගය සඳහා පිළිතුරු ගොනු කරන ලදී. 2024/08/09 දින පූර්ව-මාර්ග සම්මන්ත්‍රණය කැඳවන ලදී. පූර්ව-අත්හදා බැලීම / බේරුම් කිරීම 20/12/2024 ට සැලසුම් කර ඇත. | |
| (එ) | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉහළම ගනුදෙනුකරුවන් 25 දෙනාට රු. මිලියන 786.552 ක් වූ ණය 55 ක් ප්‍රදානය කරන ලද අතර එම ණයවල මුළු හිඟ ශේෂය 2023 සැප්තැම්බර් 30 වන විට රු. මිලියන 838.678 ක් සහ එය ප්‍රදානය කළ මුදලින් සියයට 106 ක් නියෝජනය කරයි. එයින් සියයට 38ක් ණය 'අලාභ' කාණ්ඩයට අයත් විය. එම ඉහළම අක්‍රීය ණය 25 සඳහා සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ | | |
| | (i) ණය මුදල වූ රු. මිලියන 20ක් (ණය අංකය 603086293217) වසර දෙකක් සඳහා ස්ථාවර අනුපාතයක් යටතේ ලබා දී ඇති අතර ඉන් පසුව ණය ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි අනුව පාවෙන අනුපාතිකය ලබා දිය යුතු වුවද, එය අනුගමනය කර නොමැත. | මෙය අක්‍රීය ණයක් බැවින් ණය පොලී අනුපාතිකය පරිවර්තනය කර නොතිබුණි. | බැංකුව ණය ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි වලට අනුකූල විය යුතුය. |
| | (ii) රු. මිලියන 26.6 ක (603086310931) ණයක් ලබා දීමේදී , එහි ව්‍යාපාර ආදායම/ලාභය නිසි ලෙස තක්සේරු කර නොමැත | සමාගම ආරම්භයේදී අධ්‍යක්ෂවරුන් 02 දෙනෙකු සිටියද, 2021 පෙබරවාරි මාසයේදී එක් අධ්‍යක්ෂ/කොටස් හිමියෙකු ඉල්ලා අස්වී එම අධ්‍යක්ෂ/කොටස් හිමියා සතු කොටස් ඒ ජී පී අයි පෙරේරා මහතා වෙත පැවරීය. මෙම ක්‍රියාවලිය නිසියාකාරව ලේඛනගත කර ඇති අතර, 2021 සැප්තැම්බර් මාසයේදී පාරිභෝගිකයා ණය අංක 603086297651 | ණය ලබා දීමට පෙර බැංකුව විසින් ව්‍යාපාර ආදායම/ලාභය නිසි ලෙස තක්සේරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යටතේ ලබාගත් අනෙක් ණයෙහි සාක්ෂි ලේඛන තිබේ.<br>මෙම තොරතුරු මත පදනම්ව ව්‍යාපාරයෙන් ලැබෙන සම්පූර්ණ ලාභය එකම අධ්‍යක්ෂවරයාගේ ලාභය ලෙස සලකන ලදී. | |
| (iii) | ගනුදෙනුකරුගේ පෙර අක්‍රිය තත්ත්වය නොසලකා බැංකුව විසින් රුපියල් මිලියන 28 ක (603086275196) ණයක් සඳහා අනුමැතිය ලබා දී ඇත. | CC අනුමැතිය ඇතිව මෙම ණය මුදල ලබා දී ඇත.<br><br>*<u>ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ තත්ත්වය</u>*<br>ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ ණය පහසුකම් 04ක් සහ ක්‍රෙඩිට් කාඩ් පහසුකම් 01ක් තිබී ඇත. එම වාර්තාවේ ඇති පහසුකම්වල තත්ත්වය පහත පරිදි වේ.<br>ණය 1 - යෝජිත පහසුකම ලබා දෙන අවස්ථාවේ සම්පූර්ණයෙන්ම පියවා ඇත.<br>ණය 2 සහ 3 - යෝජිත පහසුකමෙන් ලැබෙන ආදායමෙන් පියවීමට අදහස් කෙරේ.<br>ණය 4 - දින 03 ක් හිඟ සහ ක්‍රෙඩිට් කාඩ් - හිඟ දින 12 ක්. | ණය ලබා දීමට පෙර බැංකුව විසින් ගනුදෙනුකරුගේ පෙර අක්‍රිය තත්ත්වය සලකා බැලිය යුතුය. |

### 3.3.2 කාඩ්පත් මධ්‍යස්ථානයේ මෙහෙයුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචයේ (Common ATM Switch -CAS) මෙහෙයුම් සම්බන්ධයෙන් 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත (Payment and settlement System Act.) යටතේ 2022 පෙබරවාරි 28 දිනැති 2022 අංක 02 දරන පොදු නියෝගයේ 5.6 වගන්තියට අනුව, සෑම CAS සාමාජිකයෙකුම දත්ත සමුදායන් සහ CAS හි ක්‍රියාකාරිත්වයට අදාළ වන එහි සියලුම තොරතුරු සහ දත්ත නිතිපතා උපස්ථ (backup) කිරීම සහ පද්ධතියේ අසාර්ථකත්වයකදී හෝ දත්ත දූෂණය වීමකදී හෝ නැතිවීමකදී නැවත යථාවත් කිරීමේ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වගකිව යුතුය. කෙසේ වෙතත්, පාරිභෝගික මුදල් ආපසු | සියලුම යෙදුම් සම්බන්ධ උපස්ථ තොරතුරු තාක්ෂණ අංශය විසින් ගනු ලැබේ. තවද, කාඩ්පත් මධ්‍යස්ථානයේ 2024 දී “ජාල ප්‍රවේශ විය හැකි ආචයනය” (NAS) ක්‍රියාත්මක කිරීමත් සමඟ, සියලුම දෛනික ක්‍රියාකාරකම් සහ ලිපිගොනු සංකේතනය කර මධ්‍යම උපස්ථයක ගබඩා කර ඇත. | ප්‍රධාන කාර්යයන් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටිය සුමට ලෙස ක්‍රියාත්මක වීම සඳහා කාඩ්පත් මධ්‍යස්ථානය විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම, ආරවුල් හැසිරවීම, අයකිරීම් සහ සැසඳීම් වැනි සමහර ප්‍රධාන කාර්යයන් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටිය පවත්වා ගැනීමට කාඩ්පත් මධ්‍යස්ථානය අසමත් වී තිබුණි. | | |
| (ආ) | කාඩ්පත් මධ්‍යස්ථානයේ ප්‍රධාන කළමනාකරුගේ රාජකාරි, දෙවන නිලධාරියාගේ රාජකාරි, ලංකා පේ, වීසා සහ මාස්ටර් කාඩ් හුවමාරු ක්‍රියාකාරකම් සහ ප්‍රධාන කාර්යාලය ගිණුම් ප්‍රතිසන්ධානය වැනි සමහර තීරණාත්මක කාර්යයන් එකම පුද්ගලයා විසින්ම මාරු වීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ සිදු කරගෙන යාම නිසා වංචා ඇති වීමේ අවදානම ඉහල යා හැකි බව නිරීක්ෂණය විය. | අන්තර් හුවමාරු ආශ්‍රිත කටයුතු හැසිරවීමට විශේෂිත පළපුරුද්දක් තිබීම අවශ්‍ය වේ. නමුත් දැනට සිටින කාර්යමණ්ඩලයේ දක්ෂතා යොදාගෙන යම් දුරකට රාජකාරි මාරු කිරීමට බැංකුව සමත් විය. | වංචා අවදානම මඟහරවා ගැනීම සඳහා කාඩ්පත් මධ්‍යස්ථාන ක්‍රියාකාරීත්වයට අදාළ රාජකාරි නිතර නිතර මාරු කළ යුතුය. |

### 3.3.3 විරෝධී - මුදල් විශුද්ධිකරණය (AML) වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකුව 2017 වර්ෂයේදී 'COMPASS' AML මෘදුකාංගය ලබාගෙන ඇති අතර එය 2023 ඔක්තෝබර් 17 දින කල් ඉකුත් වී ඇත. සෑම මාස 06කට වරක්ම ඒ.ජ.ඩො. 16,500ක් ගෙවා 2024 අප්‍රේල් 16 දක්වා පළමු දිගුව ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙතැන් සිට 2024 ජූනි 30 විගණන දිනය දක්වා අලුත් කිරීම සිදු කර නොමැත. | බැංකුව විසින් Compass AML පද්ධතිය 2017 දී ප්‍රසම්පාදනය කර 2023 දෙසැම්බර් 17 දක්වා සේවා සපයන්නා (QDE) සමඟ නඩත්තු ගිවිසුමකට එළඹුණි. 2023 දී අධ්‍යක්ෂ මණ්ඩලය නව පද්ධතියක් මිලදී ගැනීමට තීරණය කළ අතර 2023 ජනවාරි මාසයේදී ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. RFP නව පද්ධතිය ඒකාබද්ධ කිරීම සඳහා ඉදිරිපත් කරන ලදී. නව මූලික බැංකු පද්ධතිය (Core Banking System) සමඟ AML පද්ධතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම සහ කාලසීමාව නිශ්චිත නොවීම හේතුවෙන්, ප්‍රධාන තොරතුරු නිලධාරි (CIO) විසින් අධ්‍යක්ෂක මණ්ඩලය (BOD) වෙත දන්වා නඩත්තු සේවාව මාස 3 කට වරක් දීර්ඝ කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී. AML පද්ධතියේ නව ප්‍රසම්පාදනය එම සේවා සපයන්නාට (QDE) ප්‍රදානය කරන ලද බැවින්, නඩත්තුව ක්‍රියාත්මක කිරීමත් සමඟ සහාය විය. | නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා බැංකුව විසින් මෘදුකාංගය නිතිපතා අලුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉලක්කගත මූල්‍ය සම්බාධකවලට අනුකූල නොවීම හේතුවෙන් 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රුපියල් 750,000 ක දඩ මුදලක් ගෙවීමෙන් බැංකුවට අමතර පාඩුවක් විඳීමට සිදු විය. | අනුකූලතා අංශය විසින් ක්‍රියාවලි අවස්ථාවේ පාරිභෝගිකයින් මෙන්ම දැනට සිටින පාරිභෝගිකයින් පරීක්ෂා කිරීමට සියලු පියවර ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් සියලුම කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව සහ දැනුවත් කිරීම් සිදු කරන ලදී. | අතිරේක පාඩු මගහරවා ගැනීම සඳහා බැංකුව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකුව 2008 වසරේදී පර්චස් 38.8 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 50 ක කාලයක් සඳහා ලබාගෙන ඇත. මෙම ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කළමනාකාරිත්වය තීරණය කර තිබුණද, මෙතෙක් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි. | 2008 වසරේදී මෙම ඉඩම වසර 50කට බද්දටගෙන ඇත. 2009 නොවැම්බර් මාසයේදී බැංකුව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට යාබදව පර්චස් 106.69 ක ඉඩමේ ආක්‍රමණිකයන්ව නැවත පදිංචි කිරීම සඳහා බද්දට ගත් ඉඩම ලබා දී ඇත.<br><br>මේ හේතුව නිසා එදා සිට මේ දක්වා බද්දට ගත් ඉඩමේ බැංකුව කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක නිරත වී නැත.<br>කෙසේ වෙතත්, ඉහත කී ඉඩමේ ආක්‍රමණිකයන්ට 2020 දී වෙනත් ස්ථානයක නිවාස ලබා දී ඇත. ඉන්පසුව, කොවිඩ්-19 පැතිරීම සහ රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘතිය දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදු විය. | නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |
| (ආ) | 2019 ජූනි මාසයේ සිට පිටකොටුව ශාඛාවේ ප්‍රයෝජනය සඳහා මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් බැංකුව කුලියට ගෙන තිබුණද, එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 4,629 ක විශාලත්වයෙන් යුත් තට්ටු දෙකක් භාවිතයට නොගෙන අක්‍රීයව පවතී. 2024 මැයි දක්වා කුලී වියදම් ලෙස බැංකුව රු. මිලියන 95.4ක් ගෙවා තිබුණි. | පෙර ස්ථානයේ ගොඩනැගිලි හිමිකරු එම ගොඩනැගිල්ලෙන් ඉවත් වන ලෙස බල කර ඇති අතර බැංකුව වසර 1 කට ආසන්න කාලයක් තිස්සේ පිටකොටුව ප්‍රදේශයේ සුදුසු ස්ථානයක් සොයමින් සිටියේ ය.<br>පැරණි ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබූ අතර අපගේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය කිහිප වතාවක්ම කල් ගියේය.<br>අවසාන වශයෙන්, ගොඩනැගිල්ලෙන් ඉවත් වීම බැංකුව තවදුරටත් ප්‍රමාද කරන්නේ නම්, යම් ද්‍රවශීලතා අලාභයක් ගෙවන ලෙස ගොඩනැගිලි හිමිකරු දැනුම් දී තිබුණි.<br>ඒ අවස්ථාවේදී වත්මන් ගොඩනැගිල්ල | නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යෝජනා වූ අතර පිටකොටුව ශාඛාවේ කටයුතු සඳහා එකම සුදුසු ස්ථානය එය විය. ගොඩනැගිල්ලේ ප්‍රමාණය අවශ්‍යතාවයට වඩා වැඩි වුවද, තත්ත්වය සලකා බලා යෝජිත ස්ථානයට අනුමැතිය ලබා දීමට කළමනාකාරීත්වයට සිදු විය. ගොඩනැගිල්ලේ විශාලත්වය හැරුණු විට, වාහන නැවැත්වීමේ පහසුකම්, අධික වාහන තදබදයක් ඇති ප්‍රදේශයේ පිහිටීම සමඟ ස්ථානය ඉතා හොඳින් දැකගත හැකිය. ගොඩනැගිල්ලට තනි පිවිසුමක් ඇති අතර, ගොඩනැගිල්ලේ ඇති තරප්පු පෙළ හරහා තට්ටු තුනටම ගමන් කල හැක.<br>කෙසේ වෙතත්, බැංකුව පුහුණු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා 3 වන සහ 4 වන මහල් භාවිතා කරන අතර එහි කොටසක් මේ වන විට අවට ශාඛා විසින් ගබඩා කිරීමේ අරමුණු සඳහා භාවිතා කරයි. සියලුම මහල් වසර 100 කට පෙර ලී ව්‍යුහයෙන් සාදා ඇති බැවින්, ඉහළ මහල් වල අධික බර පැටවීම සඳහා භාවිතා කිරීම අනතුරු දායක වේ. තවද, දැනටමත් ප්‍රතිසංස්කරණය කර අවසන් කර ඇති පරිශ්‍රය නැවත ලබා ගැනීම සඳහා බැංකුව ගොඩනැගිලි හිමිකරු සමඟ සාකච්ඡා කරමින් සිටී. | |
| (ඇ) | කොට්ටාව ශාඛාව විසින් 2020 අගෝස්තු සිට 2025 අගෝස්තු දක්වා (අවුරුදු 5) කාලයක් සඳහා රු. 200,000 ක මාසික කුලියට දැනට පවතින ගොඩනැගිල්ලේ පළමු මහල ලබාගෙන තිබුණි. ආරම්භයේදී ශාඛාව කුලී අත්තිකාරමක් ලෙස රු.3,600,000ක් ද, පසුව 2023 වසරේ බිම් මහල සහ පළමු මහල සඳහා කුලිය වශයෙන් රු. මිලියන 7.085 ක් ද ගෙවා ඇත. නවීකරණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2024 මැයි 31 දක්වා එම මහල භාවිත කර නොතිබුණි. | ශාඛා මෙහෙයුම් මගින් ලබා දුන් නිර්දේශය මත පවතින තදබදය හේතුවෙන් පවතින ශාඛාව පුළුල් කිරීමේ අදහසින් කොට්ටාව ශාඛාවේ ඉහළ මහල කුලියට ගෙන තිබුණි.<br>කොවිඩ් 19 ව්‍යාප්තිය අතරතුර දෙපාර්ශවය විසින් ගිවිසුම අත්සන් කර ඇති අතර රට තුළ පැවති අගුලු දැමීම (lockdown) සහ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ගොඩනැගිලි හිමිකරු ගොඩනැගිල්ල භාර දීම ප්‍රමාද විය. පසුව, පරිශ්‍ර අංශය විසින් ඇස්තමේන්තු කරන ලද ඉහළ මහල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ පිරිවැය පෙර පැවති මිලට වඩා දෙගුණයක් වීම හේතුවෙන් කළමනාකාරිත්වය විසින් කිහිප වතාවක් සංශෝධනය කරන ලදී.<br>කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව, බැංකුව යහපත් මූල්‍ය ස්ථාවරත්වයකට පැමිණෙන තෙක් | නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | බැංකුව විසින් සියළුම සංවර්ධන ව්‍යාපෘති කල් දමා ඇත. එතෙක් කිසිදු සංවර්ධන කටයුත්තක් නොමැතිව එම ඉඩ ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිත කරන ලෙස කොට්ටාව ශාඛාවේ කළමනාකරුට උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, බැංකුවේ අභ්‍යන්තර වෙනස්කම් ඉතා ඉක්මනින් සිදු කිරීමට බැංකුව පියවර ගෙන ඇත. | |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 මැයි මාසය අවසන් වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද බැංකුවේ සේවක සංඛ්‍යාව 4034 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 3529 ක් වූ වීම නිසා පුරප්පාඩු 505 ක් පැවතුණි.( සුළු සේවක,සෝදුපත් කියවන්නන් සහ යතුරු ලේඛකක හර-බැංකුකරණය කියාත්මක කරන තුරු 2024 අනුමත කරන ලද බැංකුවේ සේවක සංඛ්‍යාව තුල ඇතුලත් නැත). මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ. . | | |
| (i) | විධායක සේවක සංඛ්‍යාව වූ 871 න් 231 ක් හෙවත් සියයට 27 ක් පුරප්පාඩු වී ඇති අතර එයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 02 ක්, ප්‍රධාන කළමනාකරුවන් 15 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 21 ක් කළමනාකරුවන් 35 ක් සහ සහකාර කළමනාකරුවන් 159 ක් ඇතුළත් විය | බැංකු ධාරාවේ පුරප්පාඩු පිරවීම සඳහා 2024.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 37 දෙනෙකුට සහ කළමනාකරුවන් 87 දෙනෙකුට සහ බැංකු නොවන ධාරාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 13 දෙනෙකුට කළමනාකරුවන් 23 දෙනෙකුට උසස්වීම් ලබාදී ඇත. සහකාර කළමනාකරු ලෙස උසස් කිරීම සඳහා ලිඛිත විභාගය පවත්වා ඇත. | බැංකුව විසින් අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කළ යුතු අතර අනුමත නොකළ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. |
| (ii) | අධීක්ෂණ ශ්‍රේණියේ (III-III සහ IV ශ්‍රේණි) අනුමත සේවක සංඛ්‍යාව වූ 1261 න් 2024 මැයි මස අවසන් වන විට පුරප්පාඩු 88 ක් පැවතුණි. | විධායක නිලධාරියා (ශ්‍රේණිය lll-lll) දක්වා උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත | බැංකු කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව නතුකර ගැනීමට බැංකුව සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකළ අතිරික්ත තනතුරු 06 ක් සඳහා බැංකුව විසින් සේවකයන් බඳවාගෙන ඇත. විස්තර පහත දක්වා ඇත.<br><br>තනතුර — බඳවා ගැනීම් සංඛ්‍යාව<br>ප්‍රධාන කළමණාකරු (ශාඛා කළමනාකරණ අංශය) — 01<br>කළමණාකරු (ඉංජිනේරු/ පරිශ්‍ර) — 01<br>කළමණාකරු (මූල්‍ය) — 02<br>පරිවර්ථකවරුන් — 01<br>කළමණාකරු (අනුකූලතා) — 01<br>**එකතුව — 06** | බැංකුව කාර්ය මණ්ඩලය බඳවා ගන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇති පුරප්පාඩු මත පමණි.<br>මෙම අතිරික්ත තනතුරු නිර්මාණය කර ඇත්තේ සේවක සංඛ්‍යාව සකස් කිරීමේදී අනාගත උසස්වීම් සඳහා ප්‍රතිපාදන සැලසීම මිස අතිරික්ත බඳවා ගැනීම් නිසා නොවේ.<br>එබැවින්, මෙම අතිරික්ත සේවක සංඛ්‍යාව අනාගත උසස්වීම් සමඟ සහ සේවක සංඛ්‍යාව සමාලෝචනය කරන විට සකස් කරනු ලැබේ.. | බැංකු කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තනතුරුවල අවශ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව නතුකර ගැනීමට බැංකුව සහතික විය යුතුය. |
| (ආ) | 2021 ඔක්තෝබර් 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටු (BHRRC) රැස්වීම් වාර්තාව BHRRC පත්‍රිකා අංක BHRRC /2021/55) සහ 2021 දෙසැම්බර් 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අංක- 419/2021), බාහිරින් ලබා ගත් (Outsourced) සේවකයින්ගෙන්, බැංකුව විසින් කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 24 දෙනෙකු සහ ස්ථිර පදනම යටතේ සේවකයින් 27 දෙනෙකු බැංකුවේ සේවක සංඛ්‍යාවට බඳවාගෙන තිබුණි. මෙම සියලුම තනතුරු සඳහා විවෘත පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා නොතිබුණි. පහත කරුණු මේ සම්බන්ධයෙන් අනාවරණය විය. | දිගුකාලීන දුක්ගැනවිල්ලකට විසඳුමක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.09.17 දින පැවති රැස්වීමේදී 2019 ට පෙර 2015.03.26 දිනට බාහිරින් ලබාගන්නා පදනම මත ලබා ගත් සියලුම සේවකයින්ගේ සේවය සලකා බලා කොන්ත්‍රාත් පදනම මත අන්තර්ග්‍රහණය කිරීමට අනුමැතිය ලබා දී ඇත.<br>ඉන් අනතුරුව, 2017.03.08 දිනැති සාමාන්‍යාධිකාරීවරයා ගේ චක්‍රලේඛ අංක 902/2017 අනුව, අවම වශයෙන් වසර දෙකක කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවය කළ සේවකයින් රැකියා පරීක්ෂණයකට සහ සම්මුඛ පරීක්ෂණයකට යටත්ව ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සලකා බලා ඇත.<br>ඒ අනුව, බැංකුව දැනටමත් කාර්යාල සහකාර, යතුරු ලියනය කරන්නන්, දුරකථන ක්‍රියාකරුවන්, ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිතයන්, ඒ/සී කාර්මික, විදුලි කාර්මික, මෝටර් කාර්මික, පිළිගැනීමේ නිලධාරි සහ | තරඟකාරී බඳවා ගැනීම් සඳහා විවෘත දැන්වීමක් මගින් අදාළ තනතුරු සඳහා අයදුම්පත් කැඳවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රියැදුරන් යන කාණ්ඩ යටතේ බාහිරින් ලබාගත් සේවකයින් අන්තර්ග්‍රහණය කර ඇත. ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට නියමිත ඉහත කාණ්ඩවල සේවකයන් සුළු ප්‍රමාණයක් ඉතිරිව සිටි බැවින්, බාහිරින් ලබා ගත්/කොන්ත්‍රාත්/අභ්‍යාසලාභී පදනම මත සිටින ඉතිරි සේවකයන් පිළිබඳව තීරණයක් ගැනීමට බැංකුවට සිදු වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එම සියලුම සේවකයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සලකා බලන ලෙස සඳහන් කරමින් 2021 ඔක්තෝම්බර් 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටු රැස්වීමේදී පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | |
| (i) | 2020 ජූලි 09 දින අනුමත කරන ලද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව, කාර්යාල සහකාරවරුන් බඳවා ගැනීමේදී ලිඛිත විභාගය සහ සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට පටහැනිව, ලිඛිත විභාගයක් නොපවත්වා සේවකයින් 03 දෙනෙකු 2021 දී බඳවා ගෙන තිබුණි. | ඉහත විස්තර කර ඇති ක්‍රියා පටිපාටියම අනුගමනය කරමින් ඉහත කී සේවකයන් තිදෙනා කොන්ත්‍රාත් පදනම මත පත් කරන ලදී. 2021.12.09 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව වසර 02ක කොන්ත්‍රාත්තු කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන් රැකියා පරීක්ෂණයට මුහුණ දී මාස 06ක පරිවාස කාලයකට යටත්ව ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර ඇත. | අදාළ තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ (SOR) දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ii) | “අභ්‍යාසලාභී ඇමතුම් මධ්‍යස්ථාන ආශ්‍රිතයන්” (Trainee call Centre Associates) ලෙස සේවකයන් 17 ක් බැංකුවට බඳවාගෙන තිබුණි. ඔවුන් අතරින් අවම අධ්‍යාපන සුදුසුකම් නොමැති සේවකයන් දෙදෙනකු, 2018 දී ඔවුන්ව බාහිරින් ලබා ගන්නා අවස්ථාවේදී බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් නොමැති බව සඳහන් කරමින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර තිබුණි. කෙසේ වෙතත්, ඔවුන් | ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිත තනතුරු සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය 2018.09.07 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කර අනුමත කර ඇත. අතීතයේ දී බැංකුව බාහිරින් ලබා ගැනීමේ පදනම මත ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිතයන්ගේ සේවය ලබා ගත්තේය. මෙම යෝජනා ක්‍රමය අනුමත කිරීමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයට පෙර ඉහත කී සේවකයන් දෙදෙනකු | බැංකුවේ අනුමත SOR අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය |

කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට පෙර 2018 සැප්තැම්බර් 07 දින බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව නිරීක්ෂණය විය. 2020 වසර අවසානයේ එක් වූ තවත් සේවකයින් හය දෙනෙකුට (6) අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුව අවම සුදුසුකම් නොතිබූ අතර ඔවුන් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර නොතිබුණි. කෙසේ වෙතත්, වසර දෙකක් ඇතුළත අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර වසර 02 ක කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ආකර්ෂණය කර නොගෙන සුදුසුකම් නොමැති පුද්ගලයින්ට අවම සුදුසුකම් සම්පූර්ණ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර 02 ක කාලයක් ලබා දීම ගැටළු සහගත විය.

බැංකුවට බාහිරින් ලබා දී ඇත. එබැවින් එම සේවකයන් දෙදෙනා ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමේදී ඉහත කී යෝජනා ක්‍රමය සලකා බලා නොමැත.

තවද, ඇමතුම් මධ්‍යස්ථාන ආශ්‍රිතයන් හි යෙදවීම බාහිරින් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් විය. තවද, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2021.12.09 දින පැවති රැස්වීමේදී පහත සඳහන් වගන්තිය සිය තීරණයෙන් ඉවත් කරන ලදී. "බැංකුවේ අවම අවශ්‍යතා සමඟ සුදුසුකම් නොලබන අය වසර දෙකක කාලයක් තුළ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය" ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිත තනතුරු සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය විධිමත් කිරීමේ අරමුණින් 2018.09.07 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කර අනුමත කර ඇත. ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිත තනතුරු සඳහා අනාගත බඳවා ගැනීම්. අතීතයේ දී බැංකුව බාහිරින් ලබා ගැනීමේ පදනම මත ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිතයන්ගේ සේවය ලබා ගත්තේය.

(iii) 2020 සහ 2021 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනම යටතේ පුද්ගලයින් හය (6) දෙනෙකු රියදුරන් ලෙස බඳවාගෙන තිබුණි. රියදුරන් දෙදෙනෙකුගේ ජීව දත්ත පත්‍රිකා නිසි ක්‍රමවේදයක් ඔස්සේ අයදුම්පත් කැඳවීමකින් තොරව සාමාන්‍යාධිකාරීවරයා හරහා සභාපතිවරයා වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය විය.

ඉහත කී රියදුරන් මුලදී සේවයේ යොදවා ඇත්තේ කාර්ය මණ්ඩල අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් බාහිරින් ලබා ගැනීමේ පදනම මත ය. 2015 වසරේ සහ ඉන් පසුව බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩලය සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටියට අනුව, බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත අන්තර්ග්‍රහණය කරනු ලැබේ. වසර දෙකක කොන්ත්‍රාත් කාලය අවසානයේදී, ඔවුන් රැකියා පරීක්ෂණයකට යටත්ව ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සලකා බලන ලදී. ඒ අනුව, ඔවුන් බැංකුවේ ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරන

අදාළ තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ (SOR) දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | | අවස්ථාවේදී බැංකුව රැකියා පරීක්ෂණය (රියදුරු පරීක්ෂණය) පවත්වයි. | |
